NLB

ජාතික ලොතරැයි මණ්ඩලය

# වාර්ෂික වාර්තාව 2021

# පටුන


## 01 දළ විශ්ලේෂණය

| | |
|---|---|
| සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන් | 4 |
| නිෂ්පාදන විෂය ධාරාව | 19 |

## 02 විධායක වාර්තා

| | |
|---|---|
| සභාපතිගේ සමාලෝචනය | 27 |
| ප්‍රධාන මූල්‍ය නිළධාරිගේ කාර්යය සාධන වාර්තාව | 33 |
| විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව | 35 |

## 03 මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු

| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 37 |
| ආදායම් ප්‍රකාශය | 50 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 50 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 51 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 52 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය | 54 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 55 |

## 04 මෙහෙයුම් හා මූල්‍ය විශ්ලේෂණය

| | |
|---|---|
| මූල්‍යමය ප්‍රමුඛතාවයන් | 92 |
| සමස්ත කාර්යසාධනය | 93 |
| නිෂ්පාදන කාර්යසාධනය | 94 |
| දස වසරක මෙහෙයුම් සමාලෝචනය | 99 |

# 1

# දළ විශ්ලේෂණය

# සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන්

## සංස්ථාමය තොරතුරු

### ආයතනයේ නම
ජාතික ලොතරැයි මණ්ඩලය

### නෛතික තත්ත්වය
ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදි. 1997 වසරේදී ඉහත පනත යටතේ ඇති සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත සහ 1998 වසරේදී 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

### පිහිටුවන ලද වර්ෂය
1963

### ගිණුම් වර්ෂය අවසන් වනුයේ
දෙසැම්බර් 31

### ලියාපදිංචි කාර්යාලය
| | | |
|---|---|---|
| ලිපිනය | : | අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01 |
| දුරකථනය | : | 0114607000, 0114607001 |
| ෆැක්ස් | : | 0114669443, 0114669475, 0114669463 |
| විද්‍යුත් තැපෑල | : | info@nlb.lk |
| වෙබ් අඩවිය | : | www.nlb.lk |

### විගණක
විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

### බැංකුකරුවන්
මහජන බැංකුව
ලංකා බැංකුව
සම්පත් බැංකුව

**නියාමන ප්‍රතිපත්තීන්**

# දර්ශනය

සමස්ත දිවයිනේ සමාජ, ආර්ථික, සංවර්ධනය උදෙසා සෑම ජන කොටසකගේම දායකත්වය තුළින් රාජ්‍ය ආයෝජන නිර්මාණය කිරීමේ ප්‍රමුඛයා.

# මෙහෙවර

සමාජ වගකීම් පෙරදැරිව"පාරිභෝගික විශ්වාසය දිනාගනිමින්" ඔවුන්ගේ ජයග්‍රහණයන් තහවුරු කිරීම උදෙසා නවීන තාක්ෂණය භාවිතා කරගනිමින්,නවතාවයෙන් යුතු ලොතරැයි හඳුන්වාදෙමින්, ආශ්චර්යමත් දේශයක් උදෙසා දක්ෂ කැපවූ කාර්යය මණ්ඩලයක් සමඟ ගමන් කරන්නාවූ අභිමානවත් ආයතනයක්.

## සංවිධාන පරමාර්ථ

- රජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ඉපයීම
- රජයට ආදායම් උත්පාදනය කරන ආයතන අතරින් ප්‍රධානතම ආයතනය බවට පත්වීම
- ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම
- රටේ සේවා නියුක්තියට දායකත්වය සැපයීම

## මණ්ඩලීය අරමුණු

- පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීම
- වෙළඳපල නායකත්ව තත්ත්වය පවත්වාගෙන යාම
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම
- ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- සේවක මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව වැඩි දියුණු කිරීම
- පාරිභෝගික සංතුෂ්ඨිය වැඩි කිරීම

## ප්‍රධාන සාරධර්ම

- වගකියන සහ වගකිව යුතු ආයතනයක්
- අවංක සහ විනිවිදභාවයෙන් යුතු ආයතනයක්
- කණ්ඩායම් පරිශ්‍රමය හා නිපුණත්වය පිළිබඳ විශ්වාසය
- නවීන තාක්ෂණය හා වෙනස් වීමට ඇති අභිරුචිය
- ඉහළම පාරිභෝගික සේවාවක් පිළිබඳ විශ්වාසය

# සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපති
**නීතිඥ ලලිත් පියුම් පෙරේරා මහතා**
LLM (Business Law) Kingston, UK

## අධ්‍යක්ෂ මණ්ඩලය



**කැලුම් ප්‍රියංකර ලියනගේ මහතා**
අධ්‍යක්ෂ -ජාතික තරුණ සේවා සභාව



**ඩී.ඩී.ජයසිරි මහතා**
සහකාර අධීක්ෂක (විශ්‍රාමික)-
සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව



**එච්.සී.ඩී.එල්.සිල්වා මහතා**
(MPM.BSc.Pub.Admin. Hon., FPFA, CBA, MAAT, CIPFA)
අධ්‍යක්ෂ ජනරාල් -
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යංශය



**නීතිඥ අසංක ධයනාත් රන්දෙණිය මහතා**
LLB(Hons.) Sri Lanka, BA (SP.) (Hons.)
Colombo.

# ඉහළ කළමනාකරණය



**වයි.කේ.ශිරෝමි ජීවමාලා මිය**
MBA (e governance)
University of Moratuwa
MA (Peradeniya)
SLAS (Class I)
සාමාන්‍යාධිකාරී



**නීතිඥ සංජීව එදිරිසිංහ මහතා**
MBS (Colombo)
අතිරේක සාමාන්‍යාධිකාරී



**ආචාර්ය හර්ෂ බණ්ඩාර මහතා**
DBA, MBA, FCMA(UK), FCCA (UK), AMSLIM, FCMA(SL), FCPM, FCAA, CGMA.
ප්‍රධාන මූල්‍ය නිලධාරී

# ජ්‍යෙෂ්ඨ කළමණාකරණය



**ගීතා පෙරේරා මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම් මූල්‍ය)



**නීතිඥ ශ්‍යාමිණි බාලසූරිය මිය**
Notary public & Commissioner for oaths,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)



**කුමුදිනී මඩලුස්ස මිය**
B.Com.Special (1st Class Hons - Peradeniya)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැ.බ.)
(ආදායම් මූල්‍ය)

# මධ්‍යම කළමණාකරණය



**මෙනුර චතුරංග මයා**
MBA(Reading),BBA
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)



**කේ.ඒ. අචල ජයතිලක මයා**
B.Sc(MIS),DCSD (NIBM),MBCS,MCSSL,MICS
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)



**ඩී.එස්. වීරරත්න මයා**
MBM(Reading), B.Sc(Special-BM)
සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)



**එච්.එම්. චන්ද්‍රා හේරත් මිය**
BA, Adv.Dip. HR
සහකාර සාමාන්‍යාධිකාරී (නියෝජිත කළමණාකරන)



**ආර්.ඒ. තනූජා සම්මානි මිය**
MFE, BBA (Special-Accountancy)
අභ්‍යන්තර විගණක



**බී.ජී.ඩී. නන්දිකා රෝෂාණි ද සිල්වා මිය**
B.com (Special)
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

# මධ්‍යම කළමණාකරණය



**කසුන් කුරුඳුකුඹුර මයා**
PHD (Reading), MBS
සහකාර සාමාන්‍යාධිකාරී
(සැපයුම් හා බෙදාහැරීම්)



**කපිල සේනානායක මයා**
MBA(Reading)
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)



**ක්‍රිෂාන් ඩී. ජයසිංහ මයා**
MSc (IT & Mgt), B.Sc. (Physics)
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)



**ඩී. සුනෙත් ජයවර්ධන මයා**
BBM(Special-Marketing)
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)



**එන්.චතුර ප්‍රසන්න පෙරේරා මයා**
වරලත් ගණකාධිකාරී
MBA(Reading), B.Sc. Accounting (Special)
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

# කණිෂ්ඨ කළමණාකරණය (අභ්‍යන්තර)

1 **ඩබ්. තමාරා පෙරේරා මිය**
මහජන සම්බන්ධතා නිලධාරී

2 **එස්.ඩී.ඒ. විතාන මයා**
MIAE, NDT Auto Eng,IAE II,CGTTII(Auto)
ප්‍රවාහන නිලධාරී

3 **ලසන්ත රවීන්ද්‍ර කුමාර මයා**
අලෙවි නිලධාරී

4 **කේ.එම්.සී. සුභාෂිනී කාංගර මිය**
අලෙවි නිලධාරී

5 **දනීෂා ගුණසේකර මිය**
MBA, B.com (Accounting & Finance)
මූල්‍ය නිලධාරී

6 **එම්.ජී. විමුක්ති කෞශල්‍යා මිය**
MBS, PG Dip (HRM),PQHRM
පාලන නිලධාරී

7 **එල්. සංජීවනී මිය**
MBA, PQHRM
පෞද්ගලික සහකාර

8 **ඩී.එම්.ඩී. ලොෂන්දිකා මිය**
MA (Mass com) (Reading), PGDip. (Human Rights), BA
සන්නිවේදන නිලධාරී

9 **කේ.එල්.පී.අයි. ගුණවර්ධන මයා**
BA
ප්‍රවර්ධන නිලධාරී

10 **එන්. අරුණ ද සිල්වා මයා**
ලොතරැයිපත් ඇණවුම් නිලධාරී

11 **ප්‍රියානි හිගුරුදුව මෙය**
ත්‍යාග ගෙවීම් නිලධාරී

12 **එච්.ඒ. දීපා ප්‍රියංගනී මිය**
අයකැමි නිලධාරී

13 **නිරෝෂන් විජයවර්ධන මයා**
ප්‍රසම්පාදන නිලධාරී

14 **එන්.එන්.එම්.ඒ. උපේබා නිල්ලෙගොඩ මෙය**
MA,PGDip.(Economics),BA
මානව සම්පත් නිලධාරී

15 **ඒ.එම්. ධනුෂ්ක අත්තනායක මයා**
B.com (Special)
දිනුම් අදින ලොතරැයිපත් නිලධාරී

16 **ශිරානි කළුපහන මිය**
බිල්පත් හා ගිණුම් පියවීමේ නිලධාරී

17 **පී.වී.පී. රෝහණ හෙට්ටිආරච්චි මයා**
බෙදාහැරීමේ නිලධාරී

18 **එස්.එම්. අසංකා සමරතුංග මිය**
BA
අලෙවිකරණ නිලධාරී

19 **ජේ.එම්. අමිල මධුසංක මයා**
NDES(Civil Engineering)
නඩත්තු නිලධාරී

20 **ජේ.කේ.ඩී. බුද්ධික ජයනෙත්ති මයා**
B.Sc(Special-Agriculture)
ක්ෂණික ලොතරැයිපත් නිලධාරී

21 **කේ.එස්.එම්.ප්‍රනාන්දු මයා**
PGDip (MIT), B.Sc(MIS), HDCBIS(NIBM), DCSD (NIBM), MBCS, MCSS
පද්ධති පරිපාලක / වැඩසටහන් විශ්ලේෂක

22 **නදුනි ජයතිලක මිය**
PGDip (SLIM), MBA(Special-Marketing), MBA(Public Administration)Reading
මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරී

23 **සන්ධ්‍යා ප්‍රියානි කොඩිතුවක්කු මිය**
M.Bus(Accounting), B.Sc(Special-Finance Management)
මූල්‍ය නිලධාරී

# කණිෂ්ඨ කළමණාකරණය (ක්ෂේත්‍ර)

1 **පි.එන්.ප්‍රගීත් උයන්ගොඩ මයා**
B.Sc(Mgt-Pub)
කලාප කළමණාකරු

2 **කේ.එන්.තාරක ලියනගේ මයා**
PGDip.(MM)
කලාප කළමණාකරු

3 **බි.චින්තක ගුණරත්න මයා**
MA(Economics) Reading, BBA (Special)
කලාප කළමණාකරු

4 **ප්‍රදීප් රත්නසෝම මයා**
BBM(Special-HR)
කලාප කළමණාකරු

5 **ඒ.මංජුල වන්නිආරච්චි මයා**
B.Sc(Special-Marketing)
කලාප කළමණාකරු

6 **කේ.නෙවිල් දිමුතු මයා**
B.Sc(Special-Marketing)
කලාප කළමණාකරු

7 **එම්.පී.එල්.රෝහිත සේනාරත්න මයා**
BBM(Marketing-Special)
කලාප කළමණාකරු

8 **ආර්.පි.සරත් ජයනාම මයා**
MA(Economics), B.Sc(Special-BA)
කලාප කළමණාකරු

9 **කේ.ඒ.හිරෝන් ලසන්ත මයා**
Mphil, MA(Mass Com), BA(Hons)
කලාප කළමණාකරු

10 **කේ.එල්.ප්‍රියන්ත මයා**
MHRM,B.com (Special)
කලාප කළමණාකරු

11 **එම්.එම්.සුමිත් විජේතිලක මයා**
B.Sc(Special-HR)
කලාප කළමණාකරු

12 **එම්.එම්.පි.මංජුල කුමාර මයා**
BBA(Special-Finance)
කලාප කළමණාකරු

13 **ඩබ්.ඒ.කේ.ප්‍රියදර්ශන විජේරත්න මයා**
BBM(Special-Marketing)
කලාප කළමණාකරු

14 **බි.නුවන් චන්ද්‍රකුමාර මයා**
BBA
කලාප කළමණාකරු

15 **ආර්.ඒ.ගයාන් නිෂාර මයා**
B.Sc(Special-BA)
කලාප කළමණාකරු

16 **ඩබ්. ජේශාන් දිනේෂ් කුමාර රාජපක්ෂ මයා**
PGDip.(Marketing)
කලාප කළමණාකරු

17 **එස්.කැලුම් දර්ශන කරුණාතිලක මහතා**
BMS
කලාප කළමණාකරු

18 **ඒ.ඒ.ගයාන් සංජීව වන්නිආරච්චි මයා**
BBA(Special-Accounting)
කලාප කළමණාකරු

19 **ටි.එම්.එස්.දමිත් කුමාර ජයසුන්දර මයා**
B.Sc(Appiled Mathematics and Computing)
කලාප කළමණාකරු

20 **සුන්දරලින්ගම් නරේෂ් මයා**
BBA
කලාප කළමණාකරු

21 **අයි.තනේෂ් එමිර්සන් මයා**
BBA
කලාප කළමණාකරු

22 **සිවරාජා භාරතන් මයා**
B.Eng(Electronic &Telecommunication)
කලාප කළමණාකරු

23 **වජිතිලින්ගම් තුවාරගමන් මයා**
BBA
කලාප කළමණාකරු

24 **ජී.ආර්.චාමර තිලකරත්න මයා**
BA
කලාප කළමණාකරු

25 **ඩබ්ලිව්.කේ.ඩි වෙදගෙදර මයා**
BA(Special-Economics), PGDip. (BM)
කලාප කළමණාකරු

# ගමනෙහි ඉතිහාසය

රටේ සෞඛ්‍ය සේවාවන් වඩාත් පුළුල් කිරීමට අවශ්‍ය මුදල් උපයා ගැනීමේ අරමුණින් රජය විසින් ශ්‍රී ලංකාව තුළ ලොතරැයි ආරම්භ කිරීමට පියවර ගන්නා ලදි. 1949 වසරේ එවකට පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් ලොතරැයි පැවැත්වීම පිළිබඳ අදහස රජයට ඉදිරිපත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1955 අංක 4 දරණ පනත යටතේ ආරෝග්‍යශාලා ලොතරැයි මණ්ඩලය ඇරඹිණි.

1960 ගණන්වලදී රජයට ශ්‍රී ලංකාව තුළ ලොතරැයි ආරම්භ කිරීමේ අභිප්‍රායන් තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. අරමුදල් සෞඛ්‍ය සේවාවන්වලට අමතරව විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය විය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කරමින් 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ රටේ සංවර්ධන කටයුතු සඳහා අරමුදල් උපයා ගැනීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදි.

## ප්‍රධාන පියවරයන්

**1 වන දශකය**
1963- 1972

1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කිරීම.
1964 ජාතික ලොතරැයි මණ්ඩලයේ පළමු දිනුම් ඇදීම - ටොරින්ටන් චතුරශ්‍රය. (1964/02/20)
1965 පළමුවරට බෙන්ස් මෝටර් රථයක් පිරිනැමීම.
1967 පළමු ශාඛා කාර්යාලය රත්නපුරයෙහි ආරම්භ කිරීම.
1968 ජාතික සම්පත ලොතරැයිය හඳුන්වා දීම.
1970 ජාතික සම්පත ලොතරැයිය මහජන සම්පත ලෙසට පරිවර්තනය කිරීම. (1970/07/28)

**2 වන දශකය**
1973- 1982

1975 සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත අංක 111/1 දරණ ස්ථානයට ප්‍රධාන කාර්යාලය රැගෙන යාම.
1977 ජාතික ලොතරැයියේ මිල ශත 50 - සිට රු. 1/- දක්වා වැඩි කිරීම.

**3 වන දශකය**
1983- 1992

1987 සුපිරි ජාතික ලොතරැයිය හඳුන්වා දීම. (1987/04/11)
1988 මහජන සම්පත ලොතරැයියේ මිල රු. 1/- සිට රු. 8/- දක්වා වැඩි කිරීම.
ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම. (1988 සැප්තැම්බර්)
මහජන සම්පත ලොතරැයියේ ප්‍රථම රූපවාහිනී දිනුම් ඇදීම. (1988/05/10)
1989 මහජන සම්පත ලොතරැයියේ මිල රු. 8/- සිට රු. 10/- දක්වා වැඩි කිරීම.
1992 එයාර්පෝර්ට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය ආරම්භ කිරීම.

**4 වන දශකය**
1993- 2002

1994 වාසනා සම්පත ලොතරැයිය ආරම්භ කිරීම.
1995 ගොවිසෙත ලොතරැයිය ආරම්භ කිරීම.
1996 සමෘද්ධි ලොතරැයිය ආරම්භ කිරීම.
1997 ශ්‍රම වාසනා ලොතරැයිය ආරම්භ කිරීම.
සෙවණ ලොතරැයිය ජාතික ලොතරැයිය මණ්ඩලය හා ඒකාබද්ධ කිරීම.
1999 සුපිරි වාසනා ලොතරැයිය ආරම්භ කිරීම.
2000 ජයවිරු ලොතරැයිය ආරම්භ කිරීම.

**5 වන දශකය**
2003- 2012

2004 සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන්ට මූල්‍ය පහසුකම් සලසාදීම සඳහා සරණ ලොතරැයිය ආරම්භ කිරීම.
සේවක සුභසාධනය සඳහා සුභසාධන හා සකසුරුවම් අරමුදල ආරම්භ කිරීම.

| | |
|---|---|
| 2005 | ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයෙන් (SLIM) සිදුකරන ලද ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී බැංකු හා මූල්‍ය සේවා අංශය යටතේ වඩාත් ජනප්‍රිය වෙළඳනාමය සඳහා වන සම්මානය මහජන සම්පත ලොතරැයිය සඳහා හිමිවීම. |
| 2006 | ලොටෝ ලොතරැයිය අහෝසි කොට සුවසෙත ලොතරැයිය ආරම්භ කිරීම.<br>ලොතරැයියක් සඳහා මෙතෙක් ගෙවන ලද ඉහළම සුපිරි ත්‍යාගය මහජන සම්පතෙන් පිරිනැමීම. (රු. මිලියන 61.3) |
| 2007 | නව ගුවන් තොටුපළ ලොතරැයිය ආරම්භ කිරීම.<br>එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ මිල ඩොලර් 25 සිට 50 දක්වා වැඩි කිරීම. |
| 2008 | දිනුම් අදින ලොතරැයිවල මිල රු. 10/- සිට රු. 20/- දක්වා වැඩි කිරීම. (2008/09/02) |
| 2010 | ශ්‍රම වාසනා හා සුවසෙත ලොතරැයි දෙකම අහෝසි කර ජාතික සම්පත ලොතරැයිය ආරම්භ කිරීම.<br>මහජන සම්පත ලොතරැයිය ඉරිදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම. |
| 2011 | ඉතිහාසයේ ප්‍රථම වතාවට රු. බිලියන 10 ක අලෙවි ඉලක්කය පසු කිරීම.<br>බදාදා දිනුම් අදින ලද ජයවිරු ලොතරැයිය අහෝසි කර එදිනටත් සුපිරි වාසනා සම්පත ලොතරැයිය දිනුම් ඇදීම හඳුන්වා දීම.<br>නව ගුවන්තොටුපල ලොතරැයිය පැවැත්වීම.<br>සති තුනක් ඇතුළත රු. මිලියන 10 ට වඩා වැඩි සුපිරි ත්‍යාග 5 ක් පිරිනමන ලද අතර මින් 4 ක් එක දිගට දින 4 කදී සිදුවීම. |
| 2012 | සම්පත් රේඛා නමින් නව ලොතරැයියක් හඳුන්වා දීම.<br>ගොවිසෙත ලොතරැයිය බ්‍රහස්පතින්දා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.<br>වාසනා සම්පත ලොතරැයිය සඳුදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම. |

## වර්තමාන දශකය
2013- 2022

| | |
|---|---|
| 2013 | ගොවිසෙත ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 10 සිට රු. මිලියන 40 දක්වා වැඩි කිරීම.<br>සම්පත් රේඛා ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වැඩි කිරීම.<br>ජාතික ලොතරැයි මණ්ඩලයේ 50 වන සංවත්සරය වෙනුවෙන් මෙගා 50 නැමති ලොතරැයිය ආරම්භ කිරීම. |
| 2014 | පවර් ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම. |
| 2015 | අලෙවි සහායකයින් සඳහා දිවිසරණ රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම. (2015 ජුනි)<br>නීරෝගා ලොතරැයිය ආරම්භ කිරීම. (2015/07/25)<br>එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ 31 වෙනි දිනුම් ඇදීම. (2015/08/31)<br>එක් දිනක් තුළදී දිනුම් අදින ලොතරැයි 03ක් පැවැත්වීම ආරම්භ කිරීම. (2015/09/01 සිට)<br>ප්‍රථම වරට මහත්මා අලෙවි නියෝජිත සම්මාන උළෙල පැවැත්වීම. (2015 දෙසැම්බර්) |

2016 බිලියන 20 අලෙවි ඉලක්කය සපුරාලීම.

ඩොලර් ෆෝචූන් ලොතරැයිය ආරම්භ කිරීම. (2016/03/30)

පවර් ලොටෝ ලොතරැයිය අවලංගු කර මෙගා පවර් ලොතරැයිය හඳුන්වා දීම. (2016/05/11)

සුපිරි දෙලක්ෂපති ලොතරැයිය ආරම්භ කිරීම. (2016/05/27)

ජංගම දුරකථන කෙටි පණිවිඩ (එස්. එම්. එස්) මගින් ලොතරැයි අලෙවිය ආරම්භ කිරීම.

ගංවතුරෙන් විපතට පත් ජනතාව සඳහා මනුසත් මෙහෙවර නමින් ලොතරැයියක් ආරම්භ කිරීම.(2016/08/04)

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වොක්ෂෝල් වීදියෙහි පිහිටි ඉඩමෙහි මුල්ගල තැබීම. (2016/12/01)

ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා හා සම්මාන ප්‍රදානයේදී රාජ්‍ය ආයතන අංශය යටතේ දෙවන ස්ථානය (රිදී සම්මානය) හිමිකර ගැනීම. (ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද.)

2017 මහජන සම්පත ලොතරැයි දිනුම්වාර ගණන සතියට දින 05ක් කිරීම, බදාදා දින සහ සෙනසුරාදා දින හැර. (2017 මැයි මස සිට).

ගොවිසෙත ලොතරැයි දිනුම්වාර ගණන සතියට දින 05ක් කිරීම, සිකුරාදා සහ ඉරිදා හැර. (2017 ජුනි මස සිට)

සුපිරි ත්‍යාගය ලෙස නිවසක් පිරිනමන සෙවණ දිනුම් අදින ලොතරැයිය ආරම්භ කිරීම.

ගොවිසෙත ලොතරැයියේ සුපිරි ත්‍යාගය 2017.10.26 දින සිට මිලියන 40 සිට මිලියන 60 දක්වා වැඩි කිරීම.

එක් දිනක් තුළදී දිනුම් අදින ලොතරැයි 04ක් පැවැත්වීම ආරම්භ කිරීම ඉරිදා දින හැර. (2017 ජුලි සිට)

ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා හා සම්මාන ප්‍රදානයේදී රාජ්‍ය ආයතන අංශය යටතේ කුසලතා සම්මානයක් හිමිකර ගැනීම.(ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද.)

2017 සැප්තැම්බර් මස පැවැත්වූ සුමති ටෙලි සම්මාන උළෙලේ දී හොඳම ප්‍රචාරක දැන්වීම මහජන සම්පත ලොතරැයිය සඳහා දෙවන ස්ථානය හිමිකර ගැනීම.

2018 2018 ජනවාරි 01 මස සිට නිෂ්පාදන මිශ්‍රය වෙනස් වන ලදි.

ගොවිසෙත ලොතරැයිය සතියට දින 5ක් ලෙස පෙර පැවති දිනුම් ඇදීම වෙනුවට සතියේ දින 7 ම දිනුම් ඇදීම ආරම්භ කරන ලදි.

මෙගා පවර් ලොතරැයිය දිනුම් ඇදීම සතියට දින 02 සිට 03 දක්වා වැඩි කරන ලදි.

2018 ජනවාරි මස ජාතික සම්පත ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වැඩි කරන ලදි.

2018 ජනවාරි මස සිට නීරෝගා ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වැඩි කරන ලදි.

2018 අප්‍රේල් 2 දින ධන නිධානය ලොතරැයිය ආරම්භ කරන ලද අතර ආරම්භක දිනුම් ඇදීම 2018 මැයි මස 25 දින පවත්වන ලදි.

සම්පත් රේඛා හා දෙලක්ෂපති ලොතරැයි අහෝසි කරන ලදි.

2018 ඔක්තෝම්බර් මාසයේදී ජාතික ලොතරැයි මණ්ඩලය නො. 32, මුදලිගේ මාවත, කොටුව යන ස්ථානයේ පිහිටි නව ගොඩනැගිල්ල වෙත රැගෙන යන ලදි.

2018 ජනවාරි මස කලම්බු එයාර්පෝට් සුපඩ්‍රෝ දිනුම් ඇදීම පවත්වන ලදි.

2019 2019.11.14 දින දරු දිරි සම්පත ලොතරැයිය වෙළඳපලට හඳුන්වා දෙන ලදී. 2019.09.06 දින මහජන සම්පත 4000 දිනුම් වාරය (රන්කිරුළ ලොතරැයිය) පවත්වන ලදි.

2020 2020.07.11 දින සිට සුපිරි වාසනා ලොතරැයියේ ත්‍යාග රටාවෙහි වෙනසක් සිදු වූ අතර එහි සුපිරි ත්‍යාගය රු. මිලියන 10 සිට රු. මිලියන 2.5 දක්වා ද ප්‍රථම ත්‍යාගය රු. මිලියන 1 සිට රු. 500,000 දක්වා අඩු කරන ලදි.

එක් දිනක් තුළදී දිනුම් අදින ලොතරැයි 05ක් පැවැත්වීම ආරම්භ කිරීම. (2020 ජූලි 08 සිට)

මහජන සම්පත , ධන නිධානය සහ මෙගා පවර් ලොතරැයිපත් සතියේ දින 7 ම දිනුම් ඇදීම ආරම්භ කරන ලදී.

ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසයේ මෙතෙක් ගෙවන ලද ඉහළම සුපිරි ත්‍යාගය මෙගා පවර් ලොතරැයෙන් පිරිනැමීම. (රු. මිලියන 236)

2020.09.26 දින මහජන සම්පත ලොතරැයේ 50 වන සංවත්සරය සමරන ලදී.

ලොවපුරා පැතිර යන කොරෝනා වසංගතය ලොතරැයි කර්මාන්තයටද අහිතකර බලපෑමක් ඇති කළ අතර 2020 මාර්තු සිට මාස දෙකක කාලයක් ව්‍යාපාරික කටයුතු වසා දැමීමට මේ නිසා සිදු විය.

2021 නිෂ්පාදන මිශ්‍රයෙහි පහත වෙනස්කම් සිදු කරන ලදී.

වාසනා සම්පත ලොතරැයිය - නව ත්‍යාග රටාව 2021 පෙබරවාරි 15 දින සිට හඳුන්වා දෙන ලදී. ත්‍යාග ප්‍රතිශතය 47% සිට 52% දක්වා වැඩි කරන ලද අතර පළමු ත්‍යාගය රුපියල් මිලියන 1 සිට රුපියල් 500,000.00 දක්වා අඩු කරන ලදී.

සුපිරි වාසනා ලොතරැයිය - නව ත්‍යාග රටාව 2021 පෙබරවාරි 16 දින සිට හඳුන්වා දෙන ලදී. ත්‍යාග ප්‍රතිශතය 49% සිට 52% දක්වා වැඩි කරන ලද අතර පළමු ත්‍යාගය රුපියල් මිලියන 1 සිට රුපියල් 500,000.00 දක්වා අඩු කරන ලදී. 2021 ජූලි 25 සිට දිනුම් ඇදීමේ දින සඳුදා, සෙනසුරාදා සිට අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා ලෙස වෙනස් කරන ලදී.

ජාතික සම්පත ලොතරැයිය - දිනුම් ඇදීමේ දින 2021 අගෝස්තු 02 සිට සඳුදා සහ බ්‍රහස්පතින්දා ලෙස වෙනස් කරන ලදී. මීට පෙර එය බදාදා සහ සෙනසුරාදා විය.

මෙගා පවර් ලොතරැයිය - නව ත්‍යාග රටාව 2021 පෙබරවාරි 15 සිට හඳුන්වා දෙන ලදී. ඒ අනුව මෙගා සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි ලෙස වැඩි කරන ලද අතර පවර් සුපිරි ත්‍යාගය සහ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 10ක් ලෙස ස්ථාවර කරන ලදී.

දරුදිරි සම්පත ලොතරැයිය - නව ත්‍යාග රටාව 2021 පෙබරවාරි 21 දින සිට හඳුන්වා දෙන ලදී. ඒ අනුව ත්‍යාග ප්‍රතිශතය 47% සිට 52% දක්වා වැඩි කරන ලද අතර පළමු ත්‍යාගය රුපියල් මිලියන 1 සිට රුපියල් 500,000.00 දක්වා අඩු කරන ලදී.

2020 නොවැම්බර් 06 දින අහෝසි කරන ලද නීරෝගා ලොතරැයිය වෙනුවට 2021 පෙබරවාරි 25 දින සිට සම්පත ලග්න වරම ලොතරැයිය හඳුන්වා දෙන ලදී.

# නිෂ්පාදන විෂයධාරාව

## දිනුම් අදින ලොතරැයි

### මහජන සම්පත




**විස්තරය** : ලොතරැයි වෙළඳපලෙහි පැරණිතම ලොතරැයිය වේ. ටිකට්පතෙහි මිල රු. 20/-කි.

**දිනුම් අදින දින** : සඳුදා, අඟහරුවාදා. බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා

**ත්‍යාග** : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග

**දායකත්වය** : පිරිවැටුමෙන් 16.5% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

### වාසනා සම්පත




**විස්තරය** : 1994 වසරේ වෙළඳපලට හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු. 20/- කි.

**දිනුම් අදින දින** : සඳුදා , බ්‍රහස්පතින්දා

**ත්‍යාග** : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග. 2021 පෙබරවාරි 15 සිට නව ත්‍යාග ව්‍යුහය හඳුන්වා දෙන ලදී. ඒ අනුව රුපියල් මිලියනයක පළමු ත්‍යාගය රුපියල් ලක්ෂ 5 දක්වා අඩු විය. කෙසේ වෙතත්, ත්‍යාග ප්‍රතිශතය 47% සිට 52% දක්වා වැඩි කර ඇත.

**දායකත්වය** : අලෙවි පිරිවැටුමෙන් 16.5% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

## ගොවිසෙත



**විස්තර** : කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් ගොවි භාරකාර අරමුදලට අරමුදල් උත්පාදනය සඳහා මණ්ඩලය විසින් මෙම ලොතරැයිය 1995 වසරේදී වෙළඳපලට හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු. 20/-

**දිනුම් අදින දින** : සඳුදා, අඟහරුවාදා. බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා

**ත්‍යාග** : රු. මිලියන 60 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග.

**දායකත්වය** : පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදල හරහා කෘෂිකර්ම අමාත්‍යාංශයට ගෙවනු ලැබේ.

## සුපිරි වාසනා



**විස්තරය** : මෙම ලොතරැයිය 1999 වසරේදී හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු. 20/- කි.

**දිනුම් අදින දින** : සඳුදා,සෙනසුරාදා (2021 ජූලි 25 සිට දිනුම් ඇදීමේ දින අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා දින ලෙස වෙනස් විය.)

**ත්‍යාග** : සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 2.5 ක් වූ අතර ප්‍රථම ත්‍යාගය 500,000/- සහ අනෙකුත් සිත්ගන්නාසුළු ත්‍යාග. 2021 පෙබරවාරි 16 සිට නව ත්‍යාග ව්‍යුහය හඳුන්වා දෙන ලදී.
ඒ අනුව ත්‍යාග ප්‍රතිශතය 49% සිට 52% දක්වා වැඩි විය.

**දායකත්වය** : සඳුදා දින දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% රණවිරු සේවා අධිකාරියට දෙනු ලබන අතර සෙනසුරාදා දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% ක්‍රීඩා හා සමාජ සේවා අමාත්‍යාංශවලට ඒකාබද්ධ අරමුදල හරහා බෙදා දී ඇත.

2021 ජුලි 25 වන දින සිට අඟහරුවාදා දිනුම් ඇදීම රණවිරු සේවා අධිකාරිය වෙත ලබා දී ඇති අතර සිකුරාදා සහ ඉරිදා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදල හරහා ක්‍රීඩා හා සමාජ සේවා අමාත්‍යාංශය අතර බෙදා දී ඇත.

## ජාතික සම්පත



| | | |
|---|---|---|
| **විස්තරය** | : | සුවසෙත හා ශ්‍රම වාසනා ලොතරැයි දෙකම වෙනුවට 2010 වසරේදී මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු. 20/-. |
| **දිනුම් අදින දින** | : | බදාදා, සෙනසුරාදා (2021 අගෝස්තු 02 සිට දිනුම් ඇදීමේ දින සඳුදා, බදාදා , බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා ලෙස වෙනස් විය.) |
| **ත්‍යාග** | : | රු.මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග. |
| **දායකත්වය** | : | බදාදා දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% සෞඛ්‍ය අමාත්‍යාංශයටද සෙනසුරාදා දින දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% කම්කරු අමාත්‍යාංශයටද ඒකාබද්ධ අරමුදල හරහා බෙදාදෙනු ලැබේ. |

2021 අගෝස්තු 02 සිට සඳුදා සහ බදාදා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10% ක් සෞඛ්‍ය අමාත්‍යාංශයට දෙනු ලබන අතර බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදල හරහා කම්කරු අමාත්‍යාංශයට ලබා දෙනු ඇත.

## මෙගා පවර්




| | | |
|---|---|---|
| **විස්තරය** | : | මෙම ලොතරැයිය 2016 මැයි මස 11 දින ආරම්භ කරන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-. |
| **දිනුම් ඇදීන දින** | : | සඳුදා, අඟහරුවාදා. බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා |
| **ත්‍යාග** | : | පහත සඳහන් පරිදි ප්‍රධාන සුපිරි ත්‍යාග තුනකින් සහ රු. මිලියනයක ප්‍රථම ත්‍යාගයක් සහ සිත්ගන්නාසුළු ත්‍යාග.<br>මෙගා සුපිරි ත්‍යාගය - මිලියන 50 හෝ ඊට වැඩි<br>පවර් සුපිරි ත්‍යාගය - මිලියන 10 හෝ ඊට වැඩි<br>ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය - මිලියන 10 හෝ ඊට වැඩි<br><br>2021 පෙබරවාරි 15 සිට නව ත්‍යාග ව්‍යුහය හඳුන්වා දෙන ලදී.<br>ඒ අනුව, මෙගා සුපිරි ත්‍යාගය මිලියන 50.0 සිට මිලියන 100 දක්වා වැඩි කරන ලදී. පවර් සුපිරි ත්‍යාගය සහ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 10ක් ලෙස නියම කරන ලදී. ත්‍යාග ප්‍රතිශතය 48% කි. |
| **දායකත්වය** | : | අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි. |

## සෙවණ දිනුම් ඇදීන




| | | |
|---|---|---|
| **විස්තරය** | : | මෙම ලොතරැයිය 2017ජුලි මස 27 දින ආරම්භ කරන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-. |
| **දිනුම් ඇදීන දින** | : | ඉරිදා, බ්‍රහස්පතින්දා |
| **ත්‍යාග** | : | සුපිරි ත්‍යාගය සඳහා සුඛෝපභෝගී නිවසක් සඳහා රු. මිලියන 14ක සහ රු. මිලියනයක ප්‍රථම ත්‍යාග යක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග. |
| **දායකත්වය** | : | අලෙවි පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදල හරහා සෙවණ අරමුදලට බැර කරන ලදි. |

## ධන නිධානය



**විස්තරය** : මෙම ලොතරැයිය 2018 අප්‍රේල් මස 02 දින ආරම්භ කරන ලදි. ටිකට්පතෙහි මිල රු. 20කි.

**දිනුම් ඇදීම දින** : සඳුදා, අඟහරුවාදා. බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා

**ත්‍යාග** : රු. මිලියන 80 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

**දායකත්වය** : අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි.

## දරූ දිරි සම්පත



**විස්තරය** : මෙම ලොතරැයිය 2019 නොවැම්බර් මස 14 දින වෙළඳපලට හඳුන්වා දෙන ලදි. පළමු දිනුම් ඇදීම 2020 ජනවාරි 30 දින පැවැත්විණි. ටිකට්පතෙහි මිල රු. 20/- කි.

**දිනුම් ඇදීම දින** : බ්‍රහස්පතින්දා

**ත්‍යාග** : රු. මිලියන 05 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග. 2021 පෙබරවාරි 21 සිට නව ත්‍යාග ව්‍යුහය හඳුන්වා දෙන ලදි. ඒ අනුව, රුපියල් මිලියන 1ක පළමු ත්‍යාගය රුපියල් 500,000 දක්වා අඩු විය. ත්‍යාග ප්‍රතිශතය 47% සිට 52% දක්වා වැඩි කර ඇත.

**දායකත්වය** : අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදල හරහා දරුවන් සුරකිමු - ජාතික භාර අරමුදලට බැර කරන ලදි.




## සම්පත ලග්න වරම

**විස්තරය** : 2020 නොවැම්බර් 06 වැනි දින අහෝසි කරන ලද නීරෝගා ලොතරැයිය වෙනුවට 2021 පෙබරවාරි 25 දින සිට මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. මෙම ටිකට් පතේ මිල රු.50/- කි. එක් ටිකට් පතකට දිනුම් අවස්ථා දෙකක් ඇත.

**දිනුම් අදින දින** : වසර තුළ දිනුම් ඇදීම් පහක් පමණක් පවත්වන ලදී.

**ත්‍යාග** : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

**දායකත්වය** : අලෙවි පිරිවැටුමෙන් 10% ජාතික වකුගඩු අරමුදලට බැර කරන ලදී.




## ඩොලර් ෆෝචූන්

විස්තරය : මෙම ලොතරැයිය 2016 මාර්තු මස 30 වැනි දින හඳුන්වාදෙන ලදි. සෑම ටිකට්පතක්ම දැනට පවතින ඇමෙරිකානු ඩොලර් 10 ට හෝ ඊට සමාන පරිවර්තනය කළ හැකි ව්‍යවහාර මුදලට විකුණනු ලැබේ. ටිකට්පත් 30,000ක් විකිණී අවසන් වීමෙන් පසු දිනුම් ඇදීම පවත්වනු ලැබේ.

ත්‍යාග : ඇමෙරිකානු ඩොලර් 100,000

දායකත්වය : ශුද්ධ ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

## ක්ෂණික ලොතරැයි




### සෙවණ

| | | |
|---|---|---|
| විස්තරය | : | නිවාස ඉදිකිරීම සඳහා අරමුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් 1985 වසරේදී ආරම්භ කරන ලදි. ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගත් ජනප්‍රිය ක්ෂණික ලොතරැයියකි. සෙවණ ලොතරැයිය වෙනම ආයතනයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර පසුව 1997 වසර අවසානයේදී ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධ කරන ලදි. |
| දායකත්වය | : | අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදල හරහා නිවාස අමාත්‍යාංශයට යොමු කරන කරන ලදි. |

### සමෘද්ධි




| | | |
|---|---|---|
| **විස්තරය** | : | සමෘද්ධි අධිකාරියට අරමුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් 1996 වසරේදී මෙම ලොතරැයිය ආරම්භ කරන ලදි. මෙය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපලට හඳුන්වා දුන් පළමු ක්ෂණික ලොතරැයිය වේ. දිනුම් ලාභීන් නිශ්චය කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගෙන ඇත. |
| **දායකත්වය** | : | අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදල හරහා සමෘද්ධි හා තරුණ කටයුතු අමාත්‍යාංශයට යොමු කරන ලදි. |

# 2

# විධායක වාර්තා

# සභාපතිගේ සමාලෝචනය



"2021 වසරේදී සුපිරි ත්‍යාගලාභීන් 38 දෙනෙකු බිහිවූ අතර ඔවුන් අතර රු. මිලියන 1,381.1 ක් බෙදා දීමට මණ්ඩලයට හැකි විය."

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2021 වසරේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මුල්‍ය වසරට අදාල වාර්ෂික වාර්තාවේ සභාපතිගේ සමාලෝචනය තුළින් පසුගිය වසරේ මෙන්ම අඛණ්ඩව තෙවන වරටත් ඔබ ඇමතීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් ලෙස සලකමි.

**පසුබිම**

2019 වසරේ අගභාගයේ ආරම්භ වූ කොරෝනා වසංගතය අප රටට 2020 වසරේ දැනුනාක් මෙන්ම 2021 වසරේදී වඩාත් තීව්‍ර‍ව දැනෙන්නට විය. වසංගතය පාලනය කිරීමේ ක්‍රමවේද තවදුරටත් අනුගමනය කිරීම සිදු කළ අතර රට මාස 3 කට පමණ ආසන්න කාලයක් මුළුමනින්ම වසා දැමීමට රජයට සිදුවිය.

මෙම ගෝලීය වසංගතය සෞඛ්‍ය , ක්ෂේත්‍රය පමණක් නොව සමාජ ආර්ථික ආදී සියළු ක්ෂේත්‍රයන් කෙරේ දැඩි අර්බුදකාරී තත්ත්වයක් රට තුල පමණක් නොව ගෝලීයවද නිර්මාණය වීමට හේතු විය.

මෙහි බලපෑම් සුපුරුදු පරිදි බිම් මට්ටමේ රැකියාවල නිරතවන අපගේ සමස්ත අලෙවි ජාලයටම පසුගිය වසරේ මෙන්ම බලපාන ලද අතර සාමාන්‍ය පරිදි අලෙවි කටයුතු සිදු කිරීමේ හැකියාවක් නොපැවතිනි.

එබැවින්, 2021 වසර යනු මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා බලවත් දුෂ්කරතා මධ්‍යයේ විවිධ වූ තීන්දු තීරණ ගනිමින් උපාය මාර්ගික සැලසුම් කෙරේ වැඩි අවධානයක් යොමු කරමින් වරින් වර ඒවා වෙනස්කම්වලට ලක් කරමින් අවස්ථාවට උචිත පරිදි මෙහෙයුම් කටයුතු සිදු කිරීමට සිදු වූ වසරකි.

කෙසේවෙතත්, මෙවන් බරපතල අභියෝගාත්මක තත්ත්වයක් තිබියදීද 2021 වසරෙහි සංශෝධිත ඇස්තමේන්තු ගත අලෙවි පිරිවැටුම අත්පත් කර ගැනීමට මණ්ඩලය සමත් විය.

## මෙහෙයුම් සමාලෝචනය

පැවති අභියෝගාත්මක තත්ත්වයන් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් 2021 වසරේ අපගේ ඉලක්ක ගත අලෙවි පිරිවැටුම, රු.බිලියන 23ක් කරා යාම අපගේ අපේක්ෂාව විය. ඒ සඳහා අලෙවි මිශ්‍රය තුළද, අනෙකුත් අංශයන්වලද විවිධ වූ වෙනස්කම් සිදු කරමින් මෙහෙයුම් කටයුතු සිදු කළද කොරෝනා අර්බුදය හමුවේ අවස්ථා දෙකකදී රට මාස 3 කට ආසන්න කාලයක් වසා දැමීමට සිදුවීම මත පැන නැගුනු විවිධ බාධාවන් නිසා අපගේ සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැටුම සංශෝධනය කිරීමට අපහට සිදුවිය. ඒ අනුව, 2021 වසරේ දෙසැම්බර් 31 දිනට අපගේ ඇස්තමේන්තුගත අලෙවි පිරිවැටුම වූ රු. මිලියන 17,000.0ට සාපේක්ෂව රු.මිලියන 17,292.0 පිරිවැටුමක් අත්පත් කර ගැනීමට මණ්ඩලයට හැකි විය. කෙසේ වෙතත්, 2020 වසරෙහි අපගේ අලෙවි පිරිවැටුම වූ රු.මිලියන 18,041.1 ට සාපේක්ෂව බලන විට මෙය 4.1 % ක අඩුවීමකි. කොවිඩ් 19 අර්බුදකාරී වාතාවරණය නොවන්නට අප මුලින් අපේක්ෂා කළ පරිදි රු. බිලියන 23ක පමණ අලෙවි පිරිවැටුමක් පහසුවෙන්ම ලගා කර ගැනීමට හැකියාව තිබිණි.

2020 වසර තුල ඒකාබද්ධ අරමුදලට ලොතරැයි අලෙවියෙන් ලබාදෙන සෘජු දායකත්වය ලෙස ලබාදුන් රුපියල් මිලියන 2,205.0 ට සාපේක්ෂව 2021 වසරේ රු.මිලියන 2,162.0 ක් ලබා දිමට මණ්ඩලය සමත් විය. මෙයට අමතරව 2020 වසරේදි සෘජු බදු , වක්‍ර බදු හා හිමිකම් නොපෑ ත්‍යාග ආදිය එක් වූ විට රුපියල් මිලියන 1,134.1 ක මුදලක් වක්‍ර බදු දායකත්වය ලෙස ලබාදුන් මුදලට සාපේක්ෂව 2021 වසරේදි රු.මිලියන 851.3 ක් ලබාදෙන ලදී. එමෙන්ම 2021 වසරේ ඒකාබද්ධ අරමුදලට විශේෂ දායකත්වය ලෙස රු. මිලියන 900 ක් ලබාදෙන ලදී. සමස්තයක් ලෙස ගත් කළ 2020 වසරේදී රු.මිලියන 3,339.2 ක මුදලක් සෘජු හා වක්‍ර දායකත්වයන් ලෙස රජයට කරන ලද සම්පූර්ණ දායකත්වය ලෙස ලබාදුන් අතර එයට සාපේක්ෂව 2021 වසරේදි රු.මිලියන 3,912.0 ක මුදලක් (ඒකාබද්ධ අරමුදලට කරන ලද විශේෂ දායකත්වය වූ රු.මිලියන 900 ඇතුළුව) රජයට දීමට සමත්වීමු. මෙය පසුගිය වසරට සාපේක්ෂව 17.1% ක වැඩිවීමකි.

මහජනතාව සමග සෘජුව සම්බන්ධවෙමින් රටපුරා අලෙවි කටයුතුවල නිරතවන දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ද, අලෙවි නියෝජිතයින්ද සහ අලෙවි සහායකයින්ගෙන්ද සුසැදි 20,000 කට පමණ ආසන්න වූ අපගේ අලෙවි නියෝජිත ජාලය වෙත අලෙවි නියෝජිත කොමිස් ලෙස 2020 වසරේ ගෙවූ රු.මිලියන 3,608.0 ට සාපේක්ෂව 2021 වසරේ රු.මිලියන 3,457.5ක් ලබා දිමට මණ්ඩලය සමත් විය.

බහුතර ප්‍රමාණයක් බිම් මට්ටමේ සිටින ප්‍රජාවගෙන් සමන්විත අපගේ අලෙවි ජාලය වෙත කොවිඩ් වසංගතය හමුවේ අලෙවි කටයුතු අඩාල වීමෙන් සිදු වූ අසරණභාවය හේතුවෙන් රු.2,500 දීමනාවක් මෙවරද ලබාදෙන ලදී. එමෙන්ම මොවුනගේ සුභසාධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද වෛද්‍ය රක්ෂණාවරන ආදිය මෙම වසරේද සිදු කරන ලදී.

2020 වසරේදි ත්‍යාග සඳහා වෙන් කරන ලද රු.මිලියන 8,667.5 ට සාපේක්ෂව 2021 වසරේදි රු.මිලියන 8,352.1 ක් ත්‍යාග ලෙස ලබාදීමට හැකි විය. එය සමස්ත අලෙවි පිරිවැටුමෙන් 48.5 % වූ අතර ත්‍යාග බෙදී ගිය ආකාරය පහත පරිදි වේ.

2020 වසරේ කෝටිපති සුපිරි ත්‍යාගලාභින් 33දෙනෙකු බිහිවූ අතර ඔවුන් අතර රු.මිලියන 1,162.9 ක් බෙදා දුන් අතර එයට සාපේක්ෂව 2021 වසරේදී සුපිරි ත්‍යාගලාභින් 38 දෙනෙකු බිහිවූ අතර ඔවුන් අතර රු. මිලියන 1,318.1 ක් බෙදා දීමට මණ්ඩලයට හැකි විය.

මෙම සුපිරි ත්‍යාගලාභින් 38 දෙනා අතරින් 15 දෙනෙකුම මහජන සම්පත ලොතරැයියෙන් බිහිවූ අතර ඔවුන් අතර රු.මිලියන 320.9 ක් බෙදී ගිය අතර ගොවිසෙත ලොතරැයියෙන් හා මෙගා පවර් ලොතරැයිවලින් සුපිරි ත්‍යාගලාභින් 7 දෙනෙකු බැගින් බිහිවූ වූ අතර ඔවුන් අතර බෙදී ගිය මුදල පිළිවෙළින් රු. මිලියන 508.4 ක් හා රු. මිලියන 103.8 ක් විය. එමෙන්ම සුපිරි වාසනා හා ධන නිධානය ලොතරැයිවලින් සුපිරි ත්‍යාගලාභින් තුන් දෙනෙකු බැගින් බිහිවූ අතර ඔවුන් අතර බෙදී ගිය මුදල පිළිවෙලින්රු.මිලියන 27.8 හා රු.මිලියන 320.6 ක් විය. ජාතික සම්පත ලොතරැයියෙන් එක් සුපිරි ත්‍යාගලාභියෙක් බිහි වූ අතර රු.මිලියන 17.5 ක් ඔහු විසින් දිනා

ගන්නා ලදී. සම්පත ලග්න වරම ලොතරැයියෙන් සුපිරි ත්‍යාගලාභීන් දෙදෙනෙකු බිහිවූ අතර එක් අයෙකු සුඛෝපභෝගී මෝටර් රථයක් දිනා ගත් අතර අනෙක් සුපිරි ත්‍යාගලාභියාට රු. මිලියන 18.8 ක මුදලක් හිමිවිය.

මෙම සුපිරි ත්‍යාගලාභීන්ට අමතරව විසිලක්ෂපතියන් 303 දෙනෙක්ද, දසලක්ෂපතියන් 297දෙනෙක්ද, පන්ලක්ෂපතියන් 80 දෙනෙක්ද බිහි කිරීමට මණ්ඩලය සමත් විය. ත්‍යාග සඳහා වෙන් කරන ලද මුදලින් රු.මිලියන 1,964.3 ක් මෙම ත්‍යාග සහ සුපිරි ත්‍යාගලාභීන් සඳහා ගෙවන ලද අතර ඉතිරි මුදල වන රු. මිලියන 6,387.8 කුඩා ත්‍යාග වලට අදාල මුදල් ලෙස ජනතාවට හිමිවිනි. සමස්තයක් ලෙස ගත් කළ සුපිරි ත්‍යාගලාභීන්ද ඇතුළුව ජයග්‍රාහකයින් 163,423,012 දෙනා අතර පෙර සඳහන් කල පරිදි රු. මිලියන 8,352.1 ක මුදල බෙදී යන ලදී. අපගේ තෑගි බෙදාදීමේ යාන්ත්‍රණය පවත්නා තත්ත්වය තුල මෙම වසරේද අඩපණ වූ බැවින් සමහර අවස්ථාවල අප විසින් ඔවුන්ගේ නිවෙස් කරා ගොස් තෑගි බෙදාදීමට පසුගිය වසරේ මෙන්ම කටයුතු කළ අතර මෙය ඔවුන්ගේ ඉමහත් ප්‍රශංසාවට ලක්විය.

2020 වසරේ රු. මිලියන 1,675.1ක් වූ මෙහෙයුම් වියදම්වලට සාපේක්ෂව 2021 වසරේ මෙහෙයුම් වියදම් 1,898.5 ක් වූ අතර එනම් 13.3% කින් ඉහළ ගොස් ඇත. පසුගිය වසරට සාපේක්ෂව ආයතනික වියදම්වල අඩුවීමක් පෙන්වුවද අනෙකුත් සියලුම බාණ්ඩවල වියදම් යම් ප්‍රමාණයකින් වැඩිවීම මෙම ඉහළ යාමට හේතුවයි.

විශේෂයෙන්ම වෙළඳපල තුල ඇති වූ උද්ධමනකාරී තත්ත්වය, භාණ්ඩ හා සේවාවල හිඟයන් ආදියෙහි ප්‍රතිඵලයක් ලෙස අමුද්‍රව්‍ය වියදම්, ඉන්ධන වියදම්, සන්නිවේදන, අලෙවි ප්‍රචාරණ හා ප්‍රවර්ධන සඳහා වියදම් ආදියෙහි ඉහළ යාම මත ඒ සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීම, කොවිඩ් වසංගතය හමුවේ සනීපාරක්ෂක වියදම්, වෛද්‍ය වියදම් ඉහළයාම අනෙකුත් බාණ්ඩවල වියදම් ඉහළයාමට හේතු වූ ප්‍රධාන සාධකයන් වේ.

2020 වසරේ ලඟා කරගත් රු. මිලියන 1,434.8 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2021 වසරේ බදු පෙර ලාභය රු.මිලියන 1,003.3 ක් වූ අතර 2020 වසරේ රු.මිලියන 1083.1 ක් වූ ලාභයට සාපේක්ෂව 2021 වසරේ ලාභය රු මිලියන 960.3 ක් විය. යම් ප්‍රමාණයකින් අලෙවි පිරිවැටුම අඩුවීම හා වියදම් යම් ප්‍රමාණයකින් ඉහළ යාම ලාභය 11.3 %කින් පසුගිය වසරට වඩා අඩුවීමට හේතු විය.

කෙසේ වෙතත් විවිධ දුෂ්කරතාවයන් හමුවේ අලෙවියද පවත්වා ගනිමින් වියදම්ද යම් පාලනයකට නතු කරමින් කටයුතු කිරීම තුල මෙහෙයුම් වියදම් සමස්ථයක් ලෙස ගත් කළ පසු ගිය වසරට සාපේක්ෂව පාලනයක් යටතේ පවත්වාගෙන යාමට අපහට හැකිවිය. එය පසුගිය වසරට සාපේක්ෂව වැඩිවී ඇත්තේ 13.3% කින් වීම එයට සාක්ෂි දරයි.

ලොතරැයි අලෙවි පිරිවැටුම වැඩි කිරීම සඳහාද අඛණ්ඩව කළමණාකරනය සමග සාකච්ඡා කරමින් විවිධ උපාය මාර්ග සැලසුම් යොදන ලදී. ඒ අතරින් ලොතරැයි මිශ්‍රයේ දිනුම් ඇදීම් දිනවල වෙනස්කම් පහත පරිදි සිදු කරන ලද අතර පැවති අභියෝග අභිමුවේ අලෙවිය වැඩිකරගැනීමට එය මනා පිටිවහලක් විය.

එදිනෙදා සාමාන්‍යයෙන් සිදු කරන ලොතරැයි දිනුම් වාරවලට අමතරව විශේෂ ත්‍යාගරටාවන් යටතේ මාසිකව විශේෂ ලොතරැයි දිනුම් ඇදීම් 11 ක් පවත්වන ලදී. ඒ අනුව, ගොවිසෙත ලොතරැයියෙන් 2ක්ද, මහජන සම්පත ලොතරැයියෙන් 4ක්ද, සම්පත ලග්න වරම ලොතරැයියෙන් 5ක්ද ලෙස මෙම දිනුම් වාර පැවැත්වූ අතර මේවායෙහි සමස්ත අලෙවිය ටිකට්පත් මිලියන 17.2 ක් වූ අතර සමස්ත අලෙවි පිරිවැටුම ලෙස රු.මිලියන 431.2 ක් උපයා ගැනීමට විය.

මෙම විශේෂ ලොතරැයි සඳහා සාමාන්‍යයෙන් ලබාදෙන තෑගි වලට අමතරව විශේෂ තෑගි ලබාදෙන ලද අතර 2021 වසරේදී මේ යටතේ විගෝ (Vigo) මෝටර් රථයක්, මහේන්ද්‍රා (Mahendra) මෝටර් රථ 3 ක්, ටොයොටා රශ් (Toyota Rush) වර්ගයේ මෝටර් රථයක් ලෙස මෝටර් රථ 5ක්, ත්‍රිවිල් රථ 2ක්, මෝටර් බයිසිකලයක්, රන් මාලයක්, රන්කාසි 21ක් , ජංගම දුරකථනයක් පරිගණක 16ක්, මවුන්ටන් බයිසිකල් 24ක්, රූපවාහිනී යන්ත්‍ර 2ක්, තෑගි වවුචර්පත් 4ක් සහ මුදල් ත්‍යාග 9ක් ලබාදෙන ලදී. වාසනා සම්පත ලොතරැයියට 2021 වසරේ පෙබරවාරි සිට නව ත්‍යාගරටාවන් හඳුන්වාදෙමින් ත්‍යාග සඳහා වෙන් කිරීම් 47% සිට 52% දක්වා වැඩි කරන ලද අතර රු.මිලියන 1ක්ව පැවති ප්‍රථම ත්‍යාගය රු. ලක්ෂ 500,000 දක්වා අඩුකරන ලදී.

සුපිරි වාසනා ලොතරැයියේ ත්‍යාග රටාව පෙබරවාරි මස සිට වෙනස් කරමින් ත්‍යාග සඳහා වෙන් කිරීම් 49% සිට 52% දක්වා වැඩි කරන ලද අතර රු.මිලියන 1ක්ව පැවති ප්‍රථම ත්‍යාගය රු.ලක්ෂ 5 දක්වා අඩුකරන ලදී. සඳුදා සහ සෙනසුරාදා ලෙස පැවති දිනුම් ඇදීමේ දින ජුලි මස සිට අඟහරුවාදා, සිකුරාදා හා ඉරිදා දින ලෙස වෙනස් කරන ලදී.

බදාදා සෙනසුරාදා දිනවල දිනුම් අදින ලද ජාතික සම්පත ලොතරැයිය අගෝස්තු මස මුල සිට සඳුදා හා බ්‍රහස්පතින්දා දින දිනුම් ඇදීමට තීරණය කරන ලදී.

මෙගා පවර් ලොතරැයියට නව ත්‍යාග රටාවක් 2021 පෙබරවාරි 15 සිට හඳුන්වා දෙන ලද අතර ඒ අනුව මෙගා සුපිරි ත්‍යාගය රු.මිලියන 50 සිට 100 දක්වා වැඩිකරන ලද අතර වැඩිවෙමින් (Snow bowled) යන ලෙස පැවති පවර් හා ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාග රු. මිලියන 10 බැගින් ස්ථාවර කිරීම සිදු කරන ලදී.

දරු දිරි සම්පත ලොතරැයියෙහි නව ත්‍යාග රටාව පෙබරවාරි 21 දින සිට හඳුන්වා දෙන ලද අතර එහි ත්‍යාග සඳහා වෙන් කිරීම් 47% සිට 52% දක්වා වැඩි කරන ලදී. රු.මිලියන 1ක්ව පැවති ප්‍රථම ත්‍යාගය රු.ලක්ෂ 5 දක්වා අඩු කරන ලදී.

2020 වසරේ නොවැම්බර් මස සිට නීරෝගා ලොතරැයිය අහෝසි කර ඒ වෙනුවට 2021 පෙබරවාරි සිට සම්පත ලග්න වරම ලොතරැයිය හඳුන්වා දෙන ලදී.

2021 වසර තුලදී දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 07 දෙනෙක්ද නව අලෙවි නියෝජිතයින් 81 දෙනෙක්ද සමාලෝචිත වසර තුලදී අපගේ අලෙවි නියෝජිත ජාලයට එක් විය.

අලෙවි කටයුතු සිදු කරගෙන යාමේදී ඒ සඳහා කොඳු නාරටිය ලෙස සැලකිය හැකි අලෙවි නියෝජිත ජාලයෙහි ගැටළු හා අවශ්‍යතා හඳුනා ගනිමින් ආයතනය හා ඔවුන් අතර මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමේ අරමුණින් දිස්ත්‍රික් අලෙවි නියෝජිත හා රටපුරා අලෙවි නියෝජිත සම්මන්ත්‍රණ හා පැවැත්වීම සැලසුම් කළද 2021 වසරේ කොවිඩ් තත්ත්වය හමුවේ පැවැත්විය හැකි වුයේ දිස්ත්‍රික් අලෙවි නියෝජිත රැස්වීම් 3 ක් පමණි.

2021 වසරේ අවසාන භාගයේ මෙහෙයුම් කටයුතුවලදී අපහට මුහුණ දීමට සිදුවූ අභියෝග රාශියකි. ඉන් ප්‍රධානතම කරුණ ලෙස ටිකට්පත් මුද්‍රණ ආයතනවලට ටිකට්පත් මුද්‍රණය සඳහා අවශ්‍ය ආරක්ෂිත කඩදාසි ලබා ගැනීමේ දුෂ්කරතා මත ටිකට්පත් මුද්‍රණ කටයුතුවල ගැටළුකාරී තත්ත්වයක් උද්ගත විය.

මේ සඳහා අවශ්‍ය විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලද අතර ප්‍රසම්පාදන කටයුතුවල අවශ්‍ය සංශෝධනයන් ඇතුලත් කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online ) ටිකට්පත් අලෙවි කටයුතු කරා යාමට අවශ්‍ය මාර්ග සොයා ගැනීම ආදිය ඉන් ප්‍රධානතම කාරණා ලෙස සැලකිය හැක.

මෙහිදී මාර්ග ගත ක්‍රමය (Online ) ඔස්සේ ටිකට්පත් අලෙවියට මඟ පාදා ගැනීම, අපගේ ලොතරැයි ජාත්‍යන්තර තලයට ගෙන යාම හා විශේෂයෙන්ම විදේශගත ශ්‍රී ලාංකිකයින් අපගේ ලොතරැයි කෙරේ ආකර්ශනය කර ගැනීමේ අරමුණින් ජාතික ක්‍රිකට් ආයතනය විසින් සංවිධානය කරන ලද එල් පී එල් ක්‍රිකට් තරගාවලිය සඳහා ලොතරැයි ප්‍රචාරණ වැය ශීර්ෂ හරහා අනුග්‍රහය දැක්වීමට තීරණය කරන ලදී. මෙහිදී රටේ පවතින ඩොලර් අර්බුදයටද විසඳුමක් ලෙස ඩොලර් ලොතරැයිපතක් මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රිකට් ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ අලෙවි කිරීමටත් සැලසුම් කෙරිණි. නමුත් පුරා සති 3ක් පමණ පැවති එල් පී එල් තරගාවලිය අවසාන වනතෙක්ම අවශ්‍ය අනුමැතින් ලබා ගැනීමේ ප්‍රමාදය නිසා ජාත්‍යන්තර තලයට අපගේ ලොතරැයි හඳුන්වාදීමේ අනගි අවස්ථාව අපගෙන් ගිලිහිනි.

තවද ප්‍රවාහන පද්ධතියේ බිඳවැටීම් , ඉන්ධන හිඟතාවය ආදි හේතුවෙන් ටිකට්පත් බෙදාහැරීම් කටයුතුවල සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා එම කටයුතු කුරියර් සේවාවක් හරහා සිදු කිරීමට පියවර ගන්නා ලදී.

2020 වසරේ දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සේවය කරන ලද සේවක ප්‍රමාණය 390 ක් වූ අතර එයට සාපේක්ෂව 2021 වසරේදී සේවකයින් 377 දෙනෙකු සේවයේ නිරත විය. සේවක අභිප්‍රේණය උදෙසා මෙතෙක් ක්‍රියාත්මක කරන ලද දිරිදීමනා හා සුභසාධන ක්‍රමවේද, වෛද්‍ය හිමිකම් ආදිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර පුහුණු කිරීම් ද සුළු මට්ටමකින් සිදු කරන ලදී.

ලොතරැයි දිනුම් ඇදීම හා රූපවාහිනි විකාශය අපගේ දෛනික රාජකාරි කටයුතු අතර ප්‍රමුඛතම කාර්යය වේ. රජයේ ඩිජිටල් කරන වැඩපිළිවෙලට අනුගත වෙමින් ලොතරැයි ක්ෂේත්‍රයේද නව ප්‍රවණතාවයන් සොයා යාමේ තවත් එක් පියවරක් ලෙස ලොතරැයි දිනුම් ඇදීම නව්‍යකරණය කර ස්ථාවර පසුතලයක සිදුකළ පටිගත කිරීම් virtual system යොදා ගනිමින් සිදු කිරීමට පියවර ගැනිනි. මේ යටතේ කාලීනව පාරිභෝගික ජනතාව හා අලෙවි නියෝජිත ජාලය වෙත ඉක්මනින් යායුතු පණිවිඩ මෙම පසුතල යොදා ගනිමින් කඩිනමින් වරින් වර වෙනස් කරමින් ඉක්මනින් සන්නිවේදනය කිරීමේ හැකියාව ඇති වු අතර දිනුම් අදින අවස්ථාවේදිම අවශ්‍ය ප්‍රචාරණ කටයුත්තත් එකවර සිදුවීම ආයතනයට ප්‍රතිලාභ අත්කර දීමට සමත් විය.

## අනාගත අපේක්ෂාවන්

ටිකට්පත් මුද්‍රණ ආයතනවලට ටිකට්පත් මුද්‍රණය සඳහා අවශ්‍ය ආරක්ෂිත කඩදාසි ලබා ගැනීමේ දුෂ්කරතා මත ටිකට්පත් මුද්‍රණ කටයුතුවල ගැටළුකාරි තත්ත්වය ඉදිරි වසරේදි ද රටේ තත්ත්වය අයහපත් වුවහොත් දැඩි අර්බුදකාරි තත්ත්වයක් නිර්මාණය කිරීමට සමත් වනු ඇත. මේ සඳහා මුද්‍රිත ටිකට්පත් වලින් ඇත් වෙමින් ඩිජිටල්කරණය කරා යොමු විම කෙරේ වැඩි අවධානයක් යොමු කළ යුතුවේ.

තවද විකල්ප විසදුමක් ලෙස SMS හා Web ලොතරැයි හරහා අලෙවි කටයුතු කරන අලෙවි නියෝජිත ප්‍රමාණය වැඩිකර ගැනීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.

තවද LPL ක්‍රිකට් තරගාවලියට අනුග්‍රහය දක්වමින් ආරම්භ කිරීමට අපේක්ෂා කරන ලද( Digital lottery) ජාතික ක්‍රිකට් ආයතනයේ ප්‍රචාරණ කටයුතු සිදුකරන ආයතනය (IPG) සමග ඇති කරගත් ගිවිසුම මත ක්‍රියාවට නැංවීම හා ඒ ඔස්සේ මෙම ක්‍රමවේදයේ අවශ්‍ය නවිකරණයන් සිදුකර ලොතරැයිපත් අලෙවිය වැඩිදියුණු කිරිම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ලබන වසර මුලදී ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතය.

## ප්‍රණාමය

ගෝලීය වසංගතයේ බලපෑම සෞඛ්‍ය ක්ෂේත්‍රයට පමණක් නොව සමාජ, ආර්ථික හා සියළු ක්ෂේත්‍ර කෙරේ අහිතකර බලපෑම් එල්ල කරන තත්ත්වයක් හමුවේ වුවද අපගේ කටයුතු සඳහා නිසි මගපෙන්වීම් උපදෙස් ආදිය ලබා දෙමින් ගරු අග්‍රාමාත්‍ය හා මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන් හා 2021 වසරේ අගභාගයේ මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කළ බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිමි.

වසර පුරා මෙහෙයුම් කටයුතු සඳහා දායකත්වය ලබාදුන් රේඛිය අමාත්‍යාංශය වන මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා, නිලධාරි මඩුල්ල ඇතුළු කාර්ය මණ්ඩලයටද විශේෂයෙන් ස්තුති වන්ත වන අතර ව්‍යාපාරික කටයුතු සඳහා අප හා සම්බන්ධවන සැපයුම්, මුද්‍රණ, ප්‍රචාරණ වැනි ආයතනද අපගේ බැංකුකරු වන මහජන බැංකුවද අනෙකුත් කටයුතු සදහා අප හා එක්වන ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා සම්පත් බැංකුව වැනි ආයතන ලබාදුන් සහයෝගයට ස්තුතිවන්ත වෙමි. විගණන කටයුතු සිදුකරමින් අවශ්‍ය අවස්ථාවල නිසි මගපෙන්වීම ලබාදෙමින් කටයුතු කළ විගණකාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටද රජයේ විගණන අංශයේ නිලධාරින්ටද ස්තුතිය පුදකර සිටිමි.

අපගේ දිස්ත්‍රික් අලෙවි නියෝජිතවරු, අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින්ද ඇතුළු සමස්ත අලෙවි නියෝජිත ජාලය අපගේ ඉමහත් පැසසුමට ලක් විය යුතුය. මන්දයත් වසංගත තත්ත්වය හමුවේ පවතින අවධානමද දරාගනිමින් මහජනතාව අතරට සෘජුව සම්බන්ධවෙමින් ටිකට්පත් අලෙවිය සිදුකරන බැවිනි.

කොවිඩ් තත්ත්වය හමුවේ සේවකයින් යෙදවීමේ නිතීරිති, සේවකයින් අසනීප වීම මත සේවක හිඟය ආදිය මනාලෙස කළමණාකරනය කරමින් දැඩි කැපවීමෙන් මෙහෙයුම් කටයුතු අනලස්ව දක්ෂව ඉටුකළ ඉහළ, මධ්‍යම, කණිෂ්ඨ කළමනාකාරිත්වයද, ක්ෂේත්‍ර නිලධාරින්ද, සමස්ත සේවක මඩුල්ලටද විශේෂ ස්තුතිය පුදකර සිටිමි.

අලෙවි ජාලයේත් සේවක මඩුල්ලේත් මෙම අනර්ඝ කැපවීම නොවන්නට අපගේ අලෙවි කටයුතු මෙලෙස සාර්ථක කර ගැනීමට නොහැකිවනු ඇත.

එල්ල වූ අභියෝග හමුවේ වෙළඳපලෙහි ටිකට්පත් හිඟතාවයන් පවතින අවස්ථා තිබියදීද අප හා අපරිමිත විශ්වාසයෙන් අත්වැල් බැදගනිමින් අප හා රැඳී සිටි පාරිභෝගික ජනතාවට මාගේ ඉමහත් ප්‍රශංසාව හිමිකර දෙමි.

ඉහත කී පරිදි වසංගත තත්ත්වයේ බලපෑම් සෘජුව හා වක්‍රව ඉදිරි වසරේත් අපගේ ජනජීවිතය හා සමාජ ආර්ථික කාර්යයන් කෙරේ බලපෑම් එල්ල වීම අපේක්ෂා කල යුත්තක් වන අතර එවන් වාතාවරණයක් තුල වුව අප හා අත්වැල් බැදගනිමින් 2022 වසර සාර්ථක කර ගැනීමට කැපවීමෙන් එක්වනු ඇතැයි හුදෙක්ම අපේක්ෂා කරන අතර ඒ සඳහා අපගේ ගණුදෙනුකාර සියළු පාර්ශවයන් වෙත ආරාධනා කරමි.

**නීතිඥ ලලිත් පියුම් පෙරේරා**
සභාපති
ජාතික ලොතරැයි මණ්ඩලය.

2022 පෙබරවාරි 25 දින.

# ප්‍රධාන මූලය නිලධාරීගේ කාර්යය සාධන වාර්තාව



2021 අප්‍රේල් සිට ජුනි දක්වා සහ 2021 අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ මෙහෙයුම් කටයුතු කෙරෙහි බලපෑමක් එල්ල කරමින් නොකඩවා පැමිණි කොවිඩ් වසංගතය, දේශීය සහ ගෝලීය වශයෙන් ව්‍යාපාරික කටයුතු කෙරෙහි හිතකර තත්වයක් උදා නොකරන ලදී. 2021 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි සහ මාර්තු මාසවලදී රු. මිලියන 2,000 කට වැඩි අඛණ්ඩ අලෙවියක් වාර්තා කරමින් 2021 වර්ෂයේ පළමු කාර්තුව තුළ මණ්ඩලයේ අලෙවි කටයුතු සාර්ථකව සිදුවූ අතර රු. මිලියන 2,366ක් වූ මාර්තු මාසයේ අලෙවිය එතෙක් මෙතෙක් මණ්ඩලය විසින් වාර්තා කරන ලද ඉහළම අලෙවිය වූ අතර එය එතෙක් ඉහළම අලෙවිය ලෙස වාර්තා වී තිබූ 2016 වර්ෂයේ දෙසැම්බර් මස අලෙවිය වූ රු. මිලියන 2,220ක වාර්තාව ද අභිබවා යාමකි. අභාග්‍යයකට කොවිඩ් වසංගතයේ දෙවන රැල්ල පැමිණීමත් සමග 2021 අප්‍රේල් මස 25 වන දින සිට දින 36ක් පමණ ව්‍යාපාරික කටයුතු අත්හිටුවීමට සිදුවිය. තවද, 2021 වර්ෂයේ 21 වන දින ඇරඹි කොවිඩ් වසංගතයේ තෙවන රැල්ලේ බලපෑම 2021 වර්ෂයේ ඔක්තෝබර් 2 වන දින දක්වා පැවති අතර දින 42ක් පමණ වූ එම කාල සීමාව තුළදී කිසිදු ලොතරැයි දිනුම් ඇදීමක් නොපැවැත්වීම හේතුවෙන් නැවත වරක් ලොතරැයි ආදායම අහිමි විය.

2020 වර්ෂයේ ළඟා කර ගත් රු. මිලියන 18,041.1ක් වූ පිරිවැටුමට සාපේක්ෂව 2021 වර්ෂයේ පිරිවැටුම රු. මිලියන 17,292.0ක් වූ අතර එමගින් සියයට 4.1ක ප්‍රතිශතයක අඩුවීමක් පෙන්නුම් කරයි.මෙය රු. මිලියන 749.1ක අඩුවීමකි.

දිනුම් ඇදීම් සිදුකරනු ලබන ලොතරැයිපත් අතුරින් ලොතරැයිපත් හතරක් මගින් 2021 වර්ෂයේදී ද රු. බිලියන 1 කට අධික දායකත්වයක් ලබාදී ඇත. මහජන සම්පත ලොතරැයියෙන් රු. මිලියන 6,475 ක අලෙවි ආදායමක් ද (2020 වර්ෂයේ රු. මිලියන 5,760.1) ගොවිසෙත ලොතරැයියෙන් රු. මිලියන 4,442 ක ආදායමක් ද (2020 වර්ෂයේ රු. මිලියන 5,290.6) මෙගා පවර් ලොතරැයියෙන් රු. මිලියන 2,233 ක ආදායමක් ද ( 2020 වර්ෂයේ රු. මිලියන 3,182.5) ධන නිධානය ලොතරැයියෙන් රු. මිලියන 2,370 ක අලෙවි ආදායමක්ද (2020 වර්ෂයේ රු. මිලියන 1,122) ලැබී ඇත. සුරන ලොතරැයිපත් අතුරින් 2021 වර්ෂයේ සෙවණ ලොතරැයියේ අලෙවිය රු. මිලියන 221 ක් (2020 වර්ෂයේ රු. මිලියන 157.5) විය.

2021 වර්ෂයේ බිහිකළ සුපිරි ත්‍යාගලාභීන් සංඛ්‍යාව 38ක් වූ අතර පෙර වර්ෂයේදී එම සංඛ්‍යාව 33ක් විය. වාසනා සම්පත, දරුදිරි සම්පත සහ සුපිරි වාසනා ලොතරැයිපත්වල ත්‍යාග ව්‍යුහයන් වලට වෙනස්කම් හඳුන්වා දෙන ලදී.

මෙගා පවර් ලොතරැයියේ ප්‍රධාන සුපිරි ත්‍යාගය රු. මි. 50 සිට රු. මි. 100 දක්වා වෙනස් කරන ලද අතර අතිරේක වශයෙන් එම ලොතරැයියටම කරන ලද ප්‍රධාන වෙනස්කම් අතර අනෙක් සුපිරි ත්‍යාග දෙකෙහිද වෙනස්කම් සිදු කරන ලදි. නීරෝගා ලොතරැයියේ නාමය සම්පත ලග්න වරම ලෙස වෙනස් කිරීමත් සමග එහි ත්‍යාග ව්‍යුහයද වෙනස් කරන ලදී.

2021 වර්ෂයේදී අලෙවිය මත විශේෂ බදු ලෙස මණ්ඩලය මගින් රජයට ලබාදුන් සෘජු දායකත්වය රු. මිලියන 2,162.0 ක් වූ අතර 2020 වර්ෂයේදී රු. මිලියන 2,205.0ක් වූ එම අගය ට සාපේක්ෂව එය රු. මිලියන 43.0 ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙයට හේතු වූයේ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් තවත් ලොතරැයි දිනුම් ඇදීම් අවලංගු කිරීමට සිදුවීම නිසා අලෙවියේ සිදුවූ අඩුවීමයි. පවත්නා වර්ෂයේදී රජය වෙනුවෙන් බදු සමග ලබාදුන් සමස්ත දායකත්වය රු. මිලියන 2, 614.3ක් වූ අතර එය අලෙවියෙන් සියයට 15.1ක් විය.

2021 වර්ෂයේදී නියෝජිතායතන සඳහා කොමිස් ගෙවීම් රු. මිලියන 3, 457.5ක් වූ අතර 2021 වර්ෂයේදී ගෙවන ලද ත්‍යාග මුදල් වටිනාකම රු. මිලියන 8, 352.1 ක් විය. නියෝජිතායතන සඳහා වන කොමිස් මුදල් ගෙවීම් සහ ත්‍යාග මුදල් අඩුවීමට මෙවර ද හේතු වූයේ කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ලොතරැයි දිනුම් ඇදීම් අවලංගු කිරීම හේතුවෙන් අලෙවි කටයුතුවල සිදුවූ පසුබෑමයි.

2021 වර්ෂයේදී මණ්ඩලයේ අනෙකුත් ආදායම රු. මිලියන 416.0 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ එම අගය වූ රු. මිලියන 422.9 ට සාපේක්ෂව සුළු අඩුවීමකි. අනෙකුත් ආදායම් අතුරින් රු. මිලියන 332.9 ක මුදලක් 2021 වර්ෂයේ අතිරේක අරමුදල් ආයෝජනය කිරීමෙන් ලැබුණු අතර 2020 වර්ෂයේ එම අගය රු. මිලියන 353.3 ක් විය.

2021 වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් වියදම රු. මිලියන 1,898.4 ක් වූ අතර එය අලෙවියෙන් සියයට 10.9 ක් විය. 2020 වර්ෂයේදී එම අගය අලෙවියෙන් සියයට 9.2ක් එනම් රු. මිලියන 1, 675.1ක් විය.

2021 වර්ෂයේ බදු වලට පෙර ශුද්ධ අතිරික්තය රු. මිලියන 1,003.3 ක් එනම්, අලෙවිය මත සියයට 5.8ක් වූ අතර 2020 වර්ෂයේදී එම අගය රු. මිලියන 1,434.8 ක් එනම්, අලෙවිය මත සියයට 7.9 ක් ලෙස වාර්තා විය. 2021 වර්ෂයේදී බදු වලට පසුව රු. මිලියන 960.3 ක ලාභයක් මණ්ඩලය විසින් පෙන්වන ලද අතර පෙර වර්ෂෙයේදී එම අගය රු. මිලියන 1,083.1 ක් විය.

විශ්වීය වශයෙන් සමස්ත ආර්ථිකය කෙරෙහිම අයහපත් බලපෑමක් එල්ල කළ ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් ලොතරැයි අලෙවිය අඩුවීමක් සිදු වුවද ලාභ උත්පාදනයට අනුව මෙසේ තවත් එක් ව්‍යාපාරික වර්ෂයක් සාර්ථකව නිමාවට පත්විය.

**ආචාර්ය හර්ෂ බණ්ඩාර**
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ජාතික ලොතරැයි මණ්ඩලය.

2022 පෙබරවාරි 25 වන දින.

# විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව



විගණන හා කළමනාකරණ කමිටුව 2005 දී පිහිටුවන ලද අතර එතැන් සිට රැස්වීම් නියමිත පරිදි වසර ගණනාවක් පුරා පැවැත්විණි. 2021 වර්ෂයේදී, Covid 19 තත්ත්වය මධ්‍යයේ වුවද විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පැවැත්වීමට හැකි විය. ජාතික ලොතරැයි මණ්ඩලයේ කළමනාකරණ දුර්වලතාවයන් අවම කිරීම සඳහා විගණන වාර්තාවල දක්වා ඇති ගැටළු විසඳීමට කමිටුව සැමවිටම උපකාරී වූ අතර අවශ්‍ය විටදී ඵලදායී උපදෙස් ලබා දුන්නේය.

ජාතික ලොතරැයි මණ්ඩලයේ විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර ඔවුන් අදාළ අධිකාරීන් විසින් අනුමත කරන ලද විමර්ශන කොන්දේසිවලට අනුකූලව කමිටුව මෙහෙයෙවයි.

1. එච්.සී.ඩී.එල්. සිල්වා මහතා - සභාපති (විධායක නොවන අධ්‍යක්ෂ)
2. කේ.පී. ලියනගේ මහතා - සාමාජික (අධ්‍යක්ෂක)
3. ඩී.ඩී. ජයසිරි මහතා - සාමාජික (අධ්‍යක්ෂක)
4. තනුජා සම්මානී මහත්මිය - අභ්‍යන්තර විගණක

## නිරීක්ෂකයින්

1. ජාතික විගණන කාර්යාලයේ නියෝජිත
2. එස්. බාලසූරිය මහත්මිය - ලේකම් (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

විමර්ශන හා ඉදිරි පැහැදිලි කිරීම් සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ අදාළ නිලධාරීන්ව අවශ්‍ය අවස්ථාවන්හිදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වෙත කැඳවන ලදී.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල සම්පූර්ණත්වය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, නෛතික හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහ බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම සහ අභ්‍යන්තර විගණන කටයුතු වල කාර්යක්ෂමතාවය, සුදුසුකම් හා ස්වාධීනත්වය සුපරීක්ෂා කිරීම යනාදිය සම්බන්ධ කටයුතු වලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දැක්වීම විගණන හා කළමණාකරන කමිටුවේ නිර්දේශය හා නියාමනය වේ.

අදාළ වර්ෂය තුළ ජාතික ලොතරැයි මණ්ඩලයේ විගණකාධිපති සහ අභ්‍යන්තර විගණක විසින් නිකුත් කරන ලද විගණන වාර්තා දෙකෙහිම ඉස්මතු කර ඇති මෙහෙයුම් ගැටළු සහ කරුණු විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමීපව සමාලෝචනය කර ඇත.



**එච්.සී.ඩී.එල්. සිල්වා,**
සභාපති,
විගණන හා කළමනාකරණ කමිටුව,
ජාතික ලොතරැයි මණ්ඩලය,
කොළඹ.

2022 පෙබරවාරි 25 වන දින.

# 3

# මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටිපිඩි/එෆ්/එන්එලබී/1/21/27 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 සැප්තැම්බර් 09 දින

සභාපති

ජාතික ලොතරැයි මණ්ඩලය

**ජාතික ලොතරැයි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2016 අගෝස්තු 03 දිනැති අංක PE/LO/NLB/Gen/2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2016 වර්ෂයේ ජාතික ලොතරැයි මණ්ඩලයේ රඳවාගත් ඉපැයුම්වලින් රු.මිලියන 600 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලෙස දැනුම්දී තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී අවස්ථා 02 කදී එකතුව රු.මිලියන 550 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර තිබුණි. 2021 වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 550 ක් මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලයේ ගොඩනැගිලි සංචිත අරමුදල වෙත ලැබිය යුතු මුදලක් සඳහන් කර තිබුණි. නමුත් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ රජයේ මූල්‍ය ප්‍රකාශ තුළ ජාතික ලොතරැයි මණ්ඩලය වෙත එවැනි ගෙවිය යුතු ශේෂයක් නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2022 මැයි 25 දිනැති අංක PED/S/NLB/3/3 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් පරිදි එසේ ලබාගෙන ඇති මුදල් ඒකාබද්ධ අරමුදලට බැරවී ඇති බැවින් එම මුදල් නැවත ආපසු ලබාදීම සාමාන්‍යයෙන් සිදු නොකරන බව සඳහන් කර තිබුණි. ඒ අනුව ලැබිය යුතු ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුල වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයේ වෙනස්වීම සහ ගෙවන ලද පාරිතෝෂික දීමනා වටිනාකම රු.2,184,950 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2020 වර්ෂයේදී බැංකුවෙන් ණය මුදලක් ලෙස ලබාගෙන මණ්ඩලයේ සේවකයින්ට උත්සව අත්තිකාරම් ලෙස ලබාදෙන ලද රු.3,675,000 ක් මාසිකව බැංකුවට ආපසු ගෙවීම හා සේවකයින්ගෙන් අයකර ගැනීම සාවද්‍ය අයුරින් ගිණුම් තැබීම හේතුවෙන් අදාළ ණය වාරික හා පොලිය කාර්ය මණ්ඩලයෙන් අයකර ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සේවකයින්ගෙන් ලැබිය යුතු රු.2,915,533 ක් ජංගම වත්කම්වලද, බැංකුවට ගෙවිය යුතු රු.2,915,533 ක ජංගම වගකීම්වලද දක්වා තිබුණි.

(ඈ) 2021 දෙසැම්බර් 31 දිනට අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය රු.14,500,033 ක් විය. එකී ශේෂය තුළ 2019 වර්ෂයේ සිට විවිධ සැපයුම්කරුවන් හා ණයහිමියන් වෙත නිකුත් කළ චෙක්පත් 56 ක් මඟින් සිදුකළ ගෙවීම් ඇතුළත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවලංගු කළ චෙක්පත් ගිණුමේ ඇතුළත් ගනුදෙනු පරීක්ෂා කර අදාළ ගිණුම්වල ගැලපීම් කර අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන මහජන සම්පත ජනතාභිශේකය ස්වර්ණජයන්තිය ගිණුම වෙනුවෙන් පිළියෙල කරන ලද 2021 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව, මුදල් පොතෙහි ඇතුළත් නොවූ බැංකු ගිණුමට හර වූ සහ බැරවූ ශේෂ පිළිවෙලින් රු.72,260,545 ක් හා රු.76,970,786 ක් විය. 2010 වර්ෂයේ සිට පැවත එන එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට 2022 ජුනි 15 දින වන විටත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන, මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන්, අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ, ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව, ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි, ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා, මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.1(ඇ) ඡේද යොමුවෙහි දක්වා ඇති නිරීක්ෂණය හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන්, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නොමැත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර, යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය හා 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය | ලොතරැයි ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම් අඩුකළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රඳවාගත් ලාභවල එකතුව රු.1,529,921 ක් එලෙස ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව, 2021 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | රජයේ නීතිගත සංස්ථාවක කිසිම මුදලක් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මිස ආයෝජනය කරනු නොලැබිය යුතු වුවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.5,071,443,227 ක් හා රු.1,353,220,014 ක් පිළිවෙලින් ස්ථාවර තැන්පතුවල හා කාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15(2) හා (3) ඡේද | මණ්ඩලය විසින් 1998 වර්ෂයේදී අසරණ සරණ නමින් අරමුදලක් ආරම්භ කර එම අරමුදලට ලොතරැයි ත්‍යාගලාභීන්ගේ පරිත්‍යාග හා ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.005 ක ප්‍රමාණයක ලැබීම් බැර කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ ශේෂය රු.24,030,981 ක් වී තිබුණි. එලෙස විශේෂිත අරමුදලක් පවත්වාගෙන යාම සඳහා චක්‍රලේඛ විධිවිධාන පරිදි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. ඒ අනුව ඒකාබද්ධ අරමුදලට බැරවිය යුතු මුදල් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මණ්ඩලය වෙත රඳවාගෙන තිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණ අතර, එලෙස එක් එක් ලොතරැයිවල අලෙවි ආදායම් |

| | | |
|---|---|---|
| | | පදනම් කරගනිමින් සමාලෝචිත වර්ෂයේදී දිරිදීමනා ලෙස එකතුව රු.110,344,291 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 1993 ජනවාරි 21 දිනැති අංක PE1/70/7/Vo11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයි ආදායමෙන් සියයට 16.5 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබූ ලොතරැයි 11 කින් නියමිත ප්‍රතිශතයට වඩා අඩුවෙන්, එනම් සියයට 10 ක වටිනාකමක් පමණක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම නිසා තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වටිනාකම රු.681,851,572 ක් වී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව,

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් නිරීක්ෂණ

(01) 2021 දෙසැම්බර් 31 දින වන විට ලොතරැයි පත් අලෙවි කරන අයගෙන් රු.103,190,357 ක් අයවිය යුතුව තිබුණි. ලොතරැයි පත් අලෙවි කරන අයවලුන් විසින් ඒ සඳහා ඇපකරයන් තැබිය යුතුව තිබුණත්, එකතුව රු.20,400,906 ක ණයගැති වටිනාකම සඳහා පමණක් එලෙස ඇපකර තබා තිබුණි. ලොතරැයිපත් අලෙවි කරන ණයගැති ශේෂයෙන් සියයට 80 ක් හෙවත් එකතුව රු.82,789,451 ක ණය ශේෂය සඳහා එසේ බැංකු ඇපකර ලබා ගෙන නොතිබුණි.

(02) 2021 දෙසැම්බර් 31 දින වන විට දින 365 ක් ඉක්මවූ ණයගැති වටිනාකම රු.29,271,401 ක් වූ අතර එම අයවිය යුතු මුදල් අයකර ගැනීමට හෝ ඉන් බැංකු ඇපකර සහිත ණය ගැතියන් වටිනාකම වූ රු.2,299,197 ක බැංකු ඇපකර මුදල් කර ගැනීමට හෝ මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(03) 2021 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලයේ ලියාපදිංචි අලෙවි නියෝජිතයින් අතරින්, අලෙවි නියෝජිතයින් 64 දෙනෙකුට ක්ෂණික ලොතරැයිපත්ද, අලෙවි නියෝජිතයින් 79 දෙනෙකුට පැසිව් ලොතරැයිපත්ද ණය පදනම මත ලබාදී තිබුණු අතර ඉන් ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන් අලෙවි නියෝජිතයින් 10 දෙනෙකු හා පැසිව් ලොතරැයිපත් වෙනුවෙන් අලෙවි නියෝජිතයින් 25 දෙනෙකු පමණක් බැංකු ඇපකර ලබාදී තිබුණි. ඒ අනුව ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන් අලෙවි නියෝජිතයන් 54 දෙනෙකුගෙන් හා පැසිව් ලොතරැයිපත් වෙනුවෙන් අලෙවි නියෝජතයින් 54 දෙනෙකුගෙන් බැංකු ඇපකර ලබාගෙන නොතිබුණි.

(04) 2021 දෙසැම්බර් 31 දිනට Colombo Airport Super Draw ලොතරැයි අලෙවිය මත වූ ණයගැති ශේෂය රු.5,151,652 ක් විය. මෙම ලොතරැයි දිනුම් ඇදීම අවසන් වරට 2018 ජනවාරි 21 දින සිදුකර තිබුණි. මෙම ණයගැති ශේෂය 2022 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර එම සම්පූර්ණ වටිනාකම සඳහාම අඩමාණ ණය වෙන්කිරීමක් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලින් සිදුකර තිබුණි.

(05) විවිධ දිනුම්වාර සඳහා ඇණවුම් කරනු ලබන ලොතරැයි ප්‍රමාණයන් මුද්‍රණය කර නියමිත කාලය තුළ භාර දීමට අපොහොසත් වුවහොත්, අදාළ ගිවිසුම් ප්‍රකාරව මුද්‍රණ ආයතන වෙතින් දඩ මුදල් අය කළ යුතුව තිබුණි. එම දඩ මුදල එකී ආයතන වෙත සිදුකරන ඊළඟ ගෙවීමෙන් අඩුකර ගෙවිය යුතුව තිබුණි. 2020 ජනවාරි 20 දින සිට 2020 සැප්තැම්බර් 22 දින දක්වා පැවති ලොතරැයි දිනුම් ඇදීම් 13 කට අදාළව ලොතරැයි මුද්‍රණය කර භාරදීම ප්‍රමාදවීම නිසා මුද්‍රණකරුවන් වෙත එකතුව රු.1,031,759 ක දඩ මුදල් පනවා තිබුණු අතර, එම දඩ මුදල් සමාලෝච්ත වර්ෂය අවසන්වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(06) මූල්‍ය ප්‍රකාශනවල සේවක ණය යටතේ දක්වා තිබූ මියගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය සේවකයන්ගෙන් අයවිය යුතු උත්සව අත්තිකාරම් ලෙස එකතුව රු.2,187,952 ක් අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(07) 2021 දෙසැම්බර් 31 දින වන විට ත්‍යාග සංචිත අරමුදලේ ශේෂය රු.2,411,724,762 ක් වූ අතර, ඒ තුළ ජනාභිශේකය, මනුසත් මෙහෙවර, රන් කිරුළ හා රජ දිනුම යන ලොතරැයි දිනුම් වාර පවත්වා වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණි. ජනාභිශේකය ලොතරැයි සංචිත අරමුදලේ අවාසිදායක ශේෂය වූ රු.6,759,950 ක් හා මනුසත් මෙහෙවර, රන්

කිරුළ හා රජ දිනුම යන ලොතරැයි සංචිත අරමුදල්වල වාසිදායක ශේෂ එකතුව රු.15,166,256 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(08) 2021 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු ත්‍යාග ශේෂය ලෙස රු.1,070,847,638 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබූ අතර, ඒ තුළ පවර් ලොටෝ, රජ දිනුම, රන් කිරුළ සහ මහජන සම්පත ජනාභිශේකය ලොතරැයි වෙනුවෙන් වූ ත්‍යාග වටිනාකම් වල එකතුව රු.15,799,882 ක් වී තිබුණි. අදාළ ලොතරැයි දිනුම් ඇදීම් පවත්වා මාස 06 ක කාලය ඉක්මවා තිබුණත්, මෙම වටිනාකම් සම්බන්ධයෙන් අදාළ ත්‍යාග වටිනාකම් ජයග්‍රාහකයන් වෙත ගෙවීමට හෝ හිමිකම් නොපෑ ත්‍යාග ලෙස හඳුනා ගැනීම සිදු නොකර ගෙවිය යුතු ත්‍යාග යටතේ දක්වා තිබුණි.

(09) දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් වෙත අලෙවි කුටි ලබාදීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ එකතුව රු.1,380,400 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම පුද්ගලයින්ගෙන් අයකර ගෙන තිබුණි. අදාළ පාර්ශවයන් වෙත අලෙවි කුටි ලබා දීම හෝ ලබාගත් මුදල් නිරවුල් කිරීම හෝ සිදු නොකර එම ශේෂය තවදුරටත් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(10) අලෙවි නියෝජිතයින් විසින් ජයග්‍රාහී ලොතරැයිපත් ස්කෑන් කිරීම වෙනුවෙන් එක් ලොතරැයිපතක් වෙනුවෙන් රු.0.075 ක් මණ්ඩලය විසින් අදාළ අලෙවි නියෝජිතයින් වෙත ගෙවනු ලබයි. මෙසේ ජයග්‍රාහී ලොතරැයිපත් ස්කෑන් කිරීම වෙනුවෙන් 2020 වර්ෂයේ සිට අලෙවි නියෝජිතයින් වෙත ගෙවිය යුතු එකතුව රු.5,380,221 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමකින් තොරව වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ දක්වා තිබුණි.

(11) 2017 ජූලි 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් මණ්ඩලය දැනට පවත්වා ගෙන යන ව්‍යාපාරික පරිශ්‍රය 2020 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන පරිදි වර්ෂ 02 ක කාලයකට කුලියට ගැනීම අනුමත කර තිබුණි. එම බදු කාලය අවසන්විමෙන් පසු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත 2022 මාර්තු මාසය වන විටත් එම ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන මේ දක්වා එකතුව රු.117,782,484 ක බදු කුලී ගෙවා තිබුණි.

(12) මණ්ඩලය විසින් දැනට ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යනු ලබන පරිශ්‍රයට යාබදව ඉදිකිරීමට යෝජිත වර්ග අඩි 2,880 කින් යුත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගැනීමට 2018 ජූලි 24 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමේදී යෝජිත ගොඩනැගිල්ලේ ස්වභාවය පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කර නොතිබුණි. මෙම ගොඩනැගිල්ල විධිමත් අනුමැතියකින්

තොරවූ අනවසර ඉදිකිරීමක් වී තිබුණු අතර, මණ්ඩලය රාජ්‍ය ආයතනයක් ලෙස එසේ නීති විරෝධී ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන 2020 මැයි මාසයේ සිට 2022 අප්‍රේල් මාසය දක්වා එකතුව රු.19,784,250 ක කුලියක් ගෙවා තිබුණි.

(13) 2016 නොවැම්බර් 29 දිනැති අංක 16/2468/719/150 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මණ්ඩලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හා ඒ සඳහා රු.මිලියන 41ක උපදේශාත්මක සේවා ලබා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. එම අනුමැතිය ලබා දී සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 05 කට අධික කාලයක් ගත වී තිබුණත්, ගොඩනැගිල්ල ඉදිරිකර නොතිබුණි. 1963 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික ලොතරැයි මණ්ඩලය කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අතර, පසුගිය වර්ෂ 07 ක කාලය තුළ පමණක් කුලී ගොඩනැගිලි වෙනුවෙන් රු.399,471,200 ක් වැය කර තිබුණි.

(14) මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී හඳුන්වා දී තිබූ මධ්‍යගත Sage ACCPAC නැමැති පරිගණක මෘදුකාංගය මගින් මණ්ඩලයේ ගිණුම් කටයුතු සිදු කර තිබුණි. 2016 වර්ෂයේදී එම පද්ධතිය විමධ්‍යගත කිරීම නිසා එම මෘදුකාංගයෙන් ලබාගත හැකි සේවාවන් සීමිත වී තිබුණි. කලින් පැවති මධ්‍යගත ක්‍රමය මගින් ආයතනයේ ගනුදෙනු පිළිබඳව පැවති විශ්වාසනීයත්වයද මෙම විමධ්‍යගත ක්‍රමය යටතේ ප්‍රශ්නගත වී තිබුණු අතර, වරින්වර අදාළ වෙනස් කිරීම් නිසා ඇතිවන අවදානම්වල වගකීම් භාර ගැනීම මෙම මෘදුකාංගය හඳුන්වාදුන් සමාගමද ප්‍රතික්ෂේප කර තිබුණි.

(15) ඉකුත් වර්ෂවලදී වැඩිපුර ගෙවනලද රු.7,392,287 ක සේවක පාරිතෝෂික මුදල මණ්ඩලයට ආපසු අයකරගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද, එම මුදල අය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවා තිබුණු පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ විශ්‍රාමික නිලධාරීන්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

(16) පූර්ව විගණන කටයුතු අවසන් කර විස්තරාත්මක අලෙවි වාර්තාව (SALES DEATAIL REPORT) සහතික කිරීමෙන් පසුව, නැවත අලෙවි නියෝජිතයකු වෙත ලොතරැයිපත් 500 බැගින් එකතුව ලොතරැයි පත් 1,000 ක් අවස්ථා දෙකකදී නිකුත් කර තිබුණි. ඒ අනුව කිසියම් ලොතරැයි දිනුම් වාරයක පූර්ව විගණන කටයුතු අවසන් කර, විස්තරාත්මක අලෙවි වාර්තාව (SALES DETAIL REPORT) සහතික කිරීමෙන්ද පසු, මෙසේ පරිගණක පද්ධතිය තුළින් එම දිනුම් වාරයට අදාළව නැවත විකුණුම් ඉන්වොයිස් ඇතුළත් කිරීමට අවස්ථාව තිබීම නිසා මණ්ඩලය සතු ලොතරැයිපත් දිනුම් ඇදීමේ ක්‍රියාවලියට

අදාළ පරිගණක පද්ධතියෙන් ලබාදෙන වාර්තාවල නිරවද්‍යතාව සම්බන්ධයෙන් විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය.

(17) සමාලෝචිත වර්ෂයේ මුළු වියදමින් සියයට 57 ක ප්‍රමාණයක් විකුණුම්, අලෙවි සහ බෙදාහැරීම් වියදම් වන අතර, රු.1,074,102,918 ක් වූ එම වියදමින් සියයට 84 කට ආසන්න අගයක් අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම් වේ. එසේම අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම සමස්ථ වියදමින් සියයට 48 ක අගයක් ගෙන තිබුණි. කෙසේ වුවද, කතිපයාධිකාරි වෙළඳපල තත්ත්වයක් තුළ ක්‍රියාකරන මෙවැනි ආයතනයක් සඳහා මෙම ප්‍රචාරණ හා ප්‍රවර්ධන ක්‍රමවේදය ගැලපෙන ක්‍රමවේදයක්ද යන්න ගැටළු සහගත වේ.

(18) මණ්ඩලය සතු චොක්ෂෝල් වීදියේ පිහිටි ඉඩමේ ව්‍යාපාරික පරිශ්‍රය ඉදිකිරීම වෙනුවෙන් කෙරීගෙන යන වැඩ (Work-in Progress) ලෙස මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා උපදේශාත්මක සේවා ලබා ගැනීම වෙනුවෙන් රු.27,009,822 ක් වියදම් කර තිබුණි.

(19) ජාතික ලොතරැයි මණ්ඩලය කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලෙහි කුලී එකඟතා ගිවිසුමෙහි 08(6) ඡේදය ප්‍රකාරව, දුරකථන, ජල, විදුලි ගාස්තු වෙනුවෙන් මාස තුනක අමතර ආරක්ෂිත තැන්පතුවක් ලෙස රු.24,357,375 ක් ගෙවා තිබුණි. ගිවිසුමේ 08(9) ඡේදය ප්‍රකාරව ලබාදුන් මූලික තැන්පතුවෙන් වර්ෂ දෙක අවසන් වන විට රු.63,329,175 ක් ඉතිරිවන බව පූර්ව අවබෝධයක් සහිතව, අනාර්ථිකව ආයතනය විසින් ගොඩනැගිල්ලේ හිමිකරු වෙත රු.24,357,375 ක් අමතරව ගෙවා තිබුණි.

(20) වාර්ෂික අලෙවි ප්‍රවර්ධන හා ප්‍රචාරණ සැලසුමකින් තොරව, මණ්ඩලය විසින් අලෙවි ප්‍රවර්ධන සහ ප්‍රචාරක කටයුතු සඳහා මිලදී ගෙන තිබුණු එකතුව රු.6,354,620 ක් වූ භාණ්ඩ ගබඩාවල නිෂ්ක්‍රියව පැවතුණි.

(21) ලොතරැයි දිනුම් ඇදීම්වලදී ත්‍යාග ලෙස ලබා දීම සඳහා 2015 වර්ෂය අවසන් වනවිට මිලට ගෙන තිබුණු එකතුව රු.1,787,668 ක් වටිනා රත්තරන් කාසි සහ මාල ඇතුලු රන් භාණ්ඩ ඒකක 53 ක ප්‍රමාණයක් අදාළ කාර්යය සඳහා යොදා ගැනීමකින් තොරව බැංකු සේප්පුවල තැන්පත් කර තිබුණි. එහි වර්තමාන වටිනාකම රු. මිලියන 3.86 ක් වී තිබුණි.

(22) මණ්ඩලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, එක් ලොතරැයිපතක් ඇමරිකානු ඩොලර් 10 කට විකිණීම සඳහා 2016 වර්ෂයේදී මුද්‍රණය කරන ලද ඩොලර් ෆෝචූන් ලොතරැයිපත් 30,000 ක් අතරින් ලොතරැයිපත් 569 ක් අස්ථානගත වී තිබුණි. මෙම අස්ථානගතවූ ලොතරැයිපත්වල 2021 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.1,594,906 ක් වූ අතර, එම අස්ථානගතවීම පිළිබඳව විධිමත් පරීක්ෂණ සිදුකර වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගෙන එම අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2016 වර්ෂයේදී

මෙම ලොතරැයිය දිනුම් ඇදීමට නියමිතව තිබුණු නමුත් 2022 අප්‍රේල් 30 දින වන විටත් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(23) 2021 දෙසැම්බර් 31 දිනට අදාළව සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා අනුව මණ්ඩලයේ විවිධ අංශ 03 කට අයත් එකතුව රු.3,418,665 ක් වටිනා භාණ්ඩ සමීක්ෂණයේදී හදුනාගෙන නොතිබුණි. අංශ 11 කට අයත් එකතුව රු.1,473,327 ක් වටිනා භාණ්ඩ හානියට පත්ව තිබුණි.

(24) 2021 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු 2016/2017 හා 2017/2018 තක්සේරු වර්ෂවලට අදාල ආදායම් බදු තක්සේරුවල වටිනාකම එකතුව රු.1,785,860,482 ක් හා ඊට අදාලව පැනවූ දඩ මුදල එකතුව රු.819,379,995 ක් වී තිබුණි. 2015/2016 හා 2016/2017 වර්ෂයන්ට අදාළ එකතු කළ අගය මත බදු තක්සේරුවල වටිනාකම එකතුව රු.53,073,024 ක් හා ඊට අදාලව පැනවූ දඩ මුදල රු.39,474,184 ක් වී තිබුණි. 2016 ජුනි මාසයට අදාළ උපයන විට ගෙවීම් බදු සඳහා වූ තක්සේරුව රු.419,483 ක් හා ඊට අදාළ දඩ මුදල, රු.255,483 ක්ද වී තිබුණි. ඒ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිකුත් කර තිබුණු තක්සේරුවල හා පැනවූ දඩවල වටිනාකම රු.2,698,462,455 ක් වී තිබුණි. මෙම වටිනාකමින් 2016/2017 තක්සේරු වර්ෂයට අදාළ ආදායම් බදු සම්බන්ධයෙන් බදු අභියාචනා කොමිසමට හා ඉතිරි ඒවා සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත අභියාචනා ඉදිරිපත් කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම අභියාචනා සම්බන්ධයෙන් තීරණයන් ලබාදී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

# ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | සටහන් | **2021 රු.** | 2020 රු. |
|---|---|---|---|
| **දළ පිරිවැටුම** | 03 | 17,292,066,080 | 18,041,145,000 |
| **අඩුකළා වක්‍ර බදු** | | | |
| එකතු කළ අගය මත බදු | | 409,319,517 | 430,383,218 |
| **ශුද්ධ පිරිවැටුම** | | 16,882,746,563 | 17,610,761,782 |
| | | | |
| අඩුකළා: විකුණුම් පිරිවැය | 04 | 14,396,877,247 | 14,923,669,223 |
| **දළ ලාභය** | | 2,485,869,316 | 2,687,092,559 |
| | | | |
| එකතු කළා: වෙනත් ආදායම් | 05 | 416,022,651 | 422,918,093 |
| | | 2,901,891,967 | 3,110,010,652 |
| **අඩුකළා: වියදම්** | | | |
| විකුණුම් අලෙවි හා බෙදාහැරීමේ පිරිවැය | 06 | 1,074,102,918 | 893,002,443 |
| පරිපාලන වියදම් | 07 | 811,945,418 | 772,500,258 |
| මූල්‍ය පිරිවැය | 08 | 12,488,494 | 9,683,721 |
| **බදු පෙර ලාභ** | | 1,003,355,136 | 1,434,824,231 |
| | | | |
| අඩුකළා : ආදායම් බදු වියදම් | 09 | 43,005,519 | 351,648,230 |
| **වර්ෂය සඳහා ලාභ** | | 960,349,617 | 1,083,176,000 |

# විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | **2021 රු.** | 2020 රු. |
|---|---|---|
| වර්ෂය සඳහා ලාභ | 960,349,617 | 1,083,176,000 |
| | | |
| **පසුකාලීන කාලපරිච්ඡේදයේ දී ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොවිය යුතු විස්තීර්ණ ආදායම (ශුද්ධ බදු)** | | |
| | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක ප්‍රතිලාභ/අලාභ | 10,340,015 | (7,342,944) |
| ආයුගණක ප්‍රතිලාභ/අලාභ මත විලම්භිත බදු | (2,481,604) | 1,762,307 |
| | | |
| බදුවලින් අනතුරුව වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | 968,208,028 | 1,077,595,362 |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

| | සටහන් | **2021 රු.** | 2020 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ යන්ත්‍ර හා උපකරණ | 10 | 551,667,896 | 576,449,609 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ - ප්‍රධාන ගොඩනැගිල්ල | | 27,009,822 | 27,003,862 |
| ආයෝජන දේපළ | 11 | 24,999,802 | 26,186,048 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | - | 198,125 |
| විලම්භිත බදු වත්කම් | 13 | 8,879,808 | 8,951,500 |
| සේවක ණය | 14 | 119,605,313 | 116,961,086 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 732,162,641 | 755,750,230 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 15 | 39,277,504 | 65,402,277 |
| වෙළඳ ලැබිය යුතු | 16 | 89,936,751 | 120,484,443 |
| වෙනත් ජංගම වත්කම් | 17 | 975,592,024 | 694,229,319 |
| කෙටි කාලීන ආයෝජන | 18 | 1,078,350,718 | 681,022,942 |
| මුදල් හා මුදලට සමාන දෑ | 19 | 5,735,981,945 | 6,398,582,225 |
| මුළු ජංගම වත්කම් | | 7,919,138,942 | 7,959,721,205 |
| | | | |
| **මුළු වත්කම්** | | 8,651,301,582 | 8,715,471,435 |
| | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත ස්කන්ධ ප්‍රාග්ධනය** | | | |
| රඳවාගත් ඉපැයීම් | 20 | 1,529,921,219 | 2,486,581,712 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ අනිකුත් සංරචක | 21 | 4,501,320,640 | 3,476,452,117 |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය** | | 6,031,241,859 | 5,963,033,829 |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳියාව | 22 | 66,106,692 | 76,033,198 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 66,106,692 | 76,033,198 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 23 | 2,518,627,924 | 2,642,465,627 |
| ගෙවිය යුතු වර්තමාන බදු | 24 | 35,325,106 | 33,938,782 |
| **මුළු ජංගම වගකීම්** | | 2,553,953,030 | 2,676,404,409 |
| | | | |
| **මුළු වගකීම්** | | 2,620,059,722 | 2,752,437,606 |
| | | | |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | 8,651,301,582 | 8,715,471,435 |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS සහ SLFRS) හා 1963 අංක 11 දරන මුදල් පනතේ අවශ්‍යතාවයට මුදල් (සංශෝධන) පනතේ 1997 අංක 35 සහ 1998 අංක 22 දරන මුදල් (සංශෝධන) පනත සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ සංශෝධන වලට අනුකූල වේ.

**ආචාර්ය හර්ෂ බණ්ඩාර**
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම පැවරේ.
අත්සන් කළේ මණ්ඩලය වෙනුවෙන්,

**ලලිත් පියුම් පෙරේරා**
සභාපති

**අසංක ධයනාත් රන්දෙණිය**
අධ්‍යක්ෂ

කොළඹ
25.02.2022

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | **2021** **රු.** | 2020 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ මුදල් ගලායාම** | | |
| බදු පෙර ලාභ | 1,003,355,136 | 1,434,824,231 |
| | | |
| **ගැලපිම්** | | |
| ක්ෂය කිරීම් | 34,031,253 | 47,027,070 |
| ක්‍රම ක්ෂය කිරීම | 1,384,372 | 1,896,332 |
| අර්ථ දැක්වු ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 11,079,502 | 12,393,730 |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් ලාභ/(අලාභ) | (13,697,142) | - |
| ත්‍යාග සංචිත | - | 261,676,181 |
| විනිමය ලාභ | (740,072) | (3,022,112) |
| රඳවාගත් ඉපැයීම් සඳහා පෙර වසරේ ගැලපීම | - | (2,175,491) |
| බොල් ණය - අධි වෙන්කිරීම් | (4,373,977) | (6,020,101) |
| විවිධ ආදායම් - ලියාහරිනලද ශේෂයන් | (33,882,134) | (34,186,211) |
| පැරණි ශේෂයන් නිවැරදි කිරීම සහ ලියා හැරීම | 7,314,579 | - |
| | - | 5,336,575 |
| සංචාරක බංගලාවලින් ලැබෙන ආදායම සහ මණ්ඩලීය වාහන වලින් ලැබෙන ආදායම | (365,590) | (914,809) |
| පොලී ආදායම | (332,969,241) | (353,365,849) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | 671,136,686 | 1,363,469,547 |
| | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| තොග (වැඩිවීම්) / අඩුවීම් | 26,124,773 | 730,591 |
| වෙළඳ ලැබිය යුතු (වැඩිවීම්) / අඩුවීම් | 34,921,669 | 135,855,072 |
| වෙනත් ජංගම වත්කම් (වැඩිවීම්) / අඩුවීම් | (38,650,132) | 307,486,059 |
| එ. අ. බදු හා ජා. ගො. බදු ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | 1,386,324 | 22,341,821 |
| ත්‍යාග ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | (82,737,580) | (299,059,550) |
| රජයට කරන ලද දායකත්වය (විශේෂ බදු) ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | 19,234,041 | 12,248,415 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්) | (26,452,030) | 87,619,870 |
| | 604,963,751 | 1,630,691,825 |
| | | |
| ගෙවන ලද ආදායම් බදු | (295,378,417) | (777,758,009) |
| අර්ථ දැක්වු ප්‍රතිලාභ සැලසුම් සඳහා ගෙවන ලද පිරිවැය | (10,665,993) | (5,546,078) |
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ ශුද්ධ මුදල් ගලායාම** | 298,919,341 | 847,387,738 |

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ මුදල් ගලායාම** | | |
| දේ.ය.උ. වෙත එකතු කිරීම්, ආයෝජන දේපල, අස්පෘශ්‍ය වත්කම් සහ වැඩ ප්‍රගතිය | (9,331,720) | (7,543,547) |
| දේ.ය.උ. බැහැර කිරීමෙන් ලැබෙන ආදායම | 13,773,362 | 473,564 |
| කෙටි කාලීන ආයෝජන | (389,227,335) | (598,076,430) |
| සංචාරක බංගලාවලින් ලැබෙන ආදායම සහ මණ්ඩලීය වාහන වලින් ලැබෙන කුලී ආදායම | 301,428 | 1,037,690 |
| සේවක ණය ප්‍රදාන | (40,179,720) | (14,951,175) |
| සේවක ණය ආපසු අය කර ගැනීම් | 37,535,493 | 16,491,185 |
| ලැබුණු පොළී ආදායම් | 324,868,800 | 344,929,983 |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ ශුද්ධ මුදල් ගලායාම** | (62,259,693) | (257,638,730) |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ මුදල් ගලායාම** | | |
| රා.ආ.අ.භා.අරමුදලින් විශේෂ බදු ලෙස මහා භාණ්ඩාගාරයට මාරු කිරීම | - | (21,526,641) |
| රඳවාගත් ඉපැයුම් මගින් විශේෂ බදු ලෙස මහා භාණ්ඩාගාරයට මාරු කිරීම | (900,000,000) | - |
| CASD/NAL ලොතරැයියෙන් විශේෂ බදු ලෙස මහා භාණ්ඩාගාරයට මාරු කිරීම | - | (32,735,561) |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ ශුද්ධ මුදල් ගලායාම** | (900,000,000) | (54,262,202) |
| | | |
| වර්ෂය තුළ මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්) | (663,340,352) | 535,486,806 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ(සටහන්) | 6,399,322,297 | 5,863,095,419 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ** | 5,735,981,945 | 6,398,582,225 |
| | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්** | | |
| **මුදල් හා මුදලට සමාන දෑ** | | |
| කෙටිකාලීන ආයෝජන | 5,346,312,522 | 5,970,398,189 |
| අතැති හා බැංකු තුල ඇති මුදල් | 389,669,422 | 428,184,036 |
| වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් හා මුදලට සමාන දෑ | 5,735,981,945 | 6,398,582,225 |
| | | |
| **සටහන්:වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ** | 6,398,582,225 | 5,860,049,121 |
| එකතු කළා: විනිමය ලාභ | 740,072 | 3,022,112 |
| අඩුකළා : වර්ෂය තුළ විනිමය ලාභ/(අලාභ)ගැලපුම් | - | 24,186 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ (සටහන්) | 6,399,322,297 | 5,863,095,419 |

# ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | සමුච්චිත භාණ්ඩාගාර අරමුදල රු. | ප්‍රත්‍යාගණන සංචිත රු. | ගොඩනැගිලි සංචිත රු. | ත්‍යාග සංචිත රු. | රඳවාගත් ඉපැයීම් රු. | **එකතුව රු.** |
|---|---|---|---|---|---|---|
| **2020.01.01 දිනට ශේෂය** | 21,263,101 | 321,118,964 | 730,000,000 | 2,151,343,872 | 1,456,474,040 | 4,680,199,978 |
| දේපල,යන්ත්‍ර සහ උපකරණ විකුණුම්වල ප්‍රත්‍යාගණන ලාභ සඳහා ගැලපීම | - | (8,950,000) | - | - | 8,950,000 | - |
| ත්‍යාග සංචිතයේ ශුද්ධ වෙනස්වීම | - | - | - | 261,676,181 | - | 261,676,181 |
| SITST අරමුදල මහා භාණ්ඩාගාරයට මාරු කිරීම් (විශේෂ බදු) | - | - | - | - | (21,526,641) | (21,526,641) |
| CASD/NAL මගින් මහා භාණ්ඩාගාරයට විශේෂ බදු මාරු කිරීම | - | - | - | - | (32,735,561) | (32,735,561) |
| 2019 වර්ෂය සඳහා ගැලපීම | - | - | - | - | (2,175,491) | (2,175,491) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක අලාභ | - | - | - | - | (7,342,944) | (7,342,944) |
| නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වල ආයුගණක අලාභවලට ආරෝපණය කළ හැකි විලම්භිත බදු | - | - | - | - | 1,762,307 | 1,762,307 |
| වර්ෂය සඳහා ලාභ | - | - | - | - | 1,083,176,001 | 1,083,176,001 |
| **2020.12.31 දිනට ශේෂය** | 21,263,101 | 312,168,964 | 730,000,000 | 2,413,020,053 | 2,486,581,712 | 5,963,033,829 |
| | | | | | | |
| දේපල,යන්ත්‍ර සහ උපකරණ විකුණුම්වල ප්‍රත්‍යාගණන ලාභ සඳහා ගැලපීම | - | (13,907,498) | - | - | 13,907,498 | - |
| ත්‍යාග සංචිතයේ ශුද්ධ වෙනස්වීම | - | - | - | (1,295,290) | 1,295,290 | - |
| මහා භාණ්ඩාගාරයට මාරු කරන ලද විශේෂ බදු | - | - | - | - | (900,000,000) | (900,000,000) |
| ගොඩනැගිලි සංචිතයට ලාභය මාරු කිරීම | - | - | 1,000,000,000 | - | (1,000,000,000) | - |
| ස්ථාවර තැන්පතු පොලී ගොඩනැගිලි සංචිතයට මාරු කිරීම | - | - | 40,071,311 | - | (40,071,311) | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක ප්‍රතිලාභ | - | - | - | - | 10,340,015 | 10,340,015 |
| නැවත ගණනය කළ ප්‍රතිලාභ සැලසුම් වෙන් කිරීමට අදාළ විලම්භිත බදු | - | - | - | - | (2,481,604) | (2,481,604) |
| වර්ෂය සඳහා ලාභ | - | - | - | - | 960,349,617 | 960,349,617 |
| **2021.12.31 දිනට ශේෂය** | 21,263,101 | 298,261,466 | 1,770,071,311 | 2,411,724,763 | 1,529,921,219 | 6,031,241,857 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**සටහන් අංක 01**

**සංස්ථාමය තොරතුරු**

**1.1 වාර්තා කරන ආයතනය**

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදි. ඉහත පනතේ සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සහ 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

මෙය මුදල් අමාත්‍යාංශය යටතේ පවතින අර්ධ රාජ්‍ය ආයතනයකි. ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන පිහිටා ඇත්තේ කොළඹ 01, දේශමාන්‍ය එන්. ඩබ්. ජේ. මුදලිගේ මාවත, අංක 32 දරණ ස්ථානයේ ය.

**1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය**

ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අභිලාශය රජයට ආදායම් උත්පාදනය සඳහා ජාතික ලොතරැයි පැවැත්වීමයි.

**1.3 මූල්‍ය කාලපරිච්ඡේදය**

මණ්ඩලයේ මූල්‍ය කාලපරිච්ඡේදය වන්නේ 2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස දොළහක කාලයයි.

**1.4. මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද නව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති (LFRS/LKAS) අනුකූලව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.

මෙම මූල්‍ය ප්‍රකාශනවල පහත සංරචක අඩංගු වේ.

- විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය වර්ෂය අවසානයේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරයි.
- ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්කම් ප්‍රකාශය සමාලෝචිත වර්ෂයෙහි මණ්ඩලයේ අරමුදල්වල වෙනස්වීම විස්තර කරයි.
- අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් හා මුදලට සමාන දෑ උත්පාදනය සඳහා මණ්ඩලයට ඇති හැකියාව හා මෙම අරමුදල් උපයෝජනයේ අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු සපයයි.
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනිකුත් විස්තරාත්මක තොරතුරු ඇතුළත් වේ.

**සටහන් අංක 02**

**2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

**2.1 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්**

**2.1.1. ගිණුම් පිළියෙල කිරීමේ පදනම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS)අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම හා සත්‍ය වටිනාකම් පදනම යටතේ උපචිත පදනමට ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 පෙබරවාරි 25 දින අධිකාරී බලය පවරන ලදි.

### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ පිලියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS & SLFRS)සහ 1963 අංක 11 සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවය.

### 2.1.3 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරුවක් කර ඇති අතර අස්තිත්වය ඈවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට ඔවුන් අපේක්ෂා නොකරයි. පූර්වේක්ෂිත අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන යාමට සම්පත් තමන් සතු බවට කළමනාකාරිත්වය සෑහීමකට පත් වෙයි. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස  දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව මත සැලකිය යුතු සැකයන් පහළ කරන්නා වූ කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ කළමනාකාරිත්වය නොදනී. එබැවින් අඛණ්ඩ පැවැත්ම පදනමක් මත මූල්‍ය ප්‍රකාශ නොකඩවා පිළියෙල කරනු ලැබේ.

### 2.1.4 සන්සන්දනාත්මක තොරතුරු

මණ්ඩලය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව යොදාගෙන ඇති අතර ඒවා පෙර වසරේ ප්‍රතිපත්ති සමග සංගත වේ. ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තන්හිදී පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ නැවත සකස් කර හා ප්‍රතිවර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 - 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ' ප්‍රකාරව පෙර වසරේ ගිණුම්කරණ ප්‍රමිති සමග  මණ්ඩලය විසින් මෙම ප්‍රමිති සංගතව ආදේශ කොට ඇත.

### 2.1.5 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

සියලු විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුකළ අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට (එතැන් විනිමය අනුපාතය) වාර්තාකරණ ව්‍යවහාර මුදල් ඒකකය මත ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ සහ මූල්‍ය අයිතම වසර අවසාන විනිමය අනුපාතයන්ට ප්‍රති මැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන්, ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලින් සඳහන් කර ඇති මූල්‍ය වත්කම් හෝ බැරකම්, වසර අවසාන එතැන් විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලින් සමාන අගයට පරිවර්තනය කරනු ලබන අතර, එයින් ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන් ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කරනු ලැබේ.

### 2.1.6 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ පහත දැක්වෙන ද්‍රව්‍යමය අයිතම හැරුණු විට, මූල්‍ය ප්‍රකාශ පිලියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය ප්‍රකාරවය.

- ලාභය හෝ අලාභය හරහා  සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.
- නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා බැරකම්, නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ සහ හඳුනා නොගත් ආයු ගණන වැනි එකතුව, අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභයෙන් අඩු කොට වත්මන් වටිනාකමට හඳුනාගනු ලැබේ.
- විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නාවූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.
මුදල් ප්‍රවාහයන් පිළිබඳ තොරතුරු හැර මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම අනුව සකස් කර ඇත.

**2.1.7 ව්‍යවහාර සහ වාර්තාකරණ මුදල් ඒකක**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, මණ්ඩලය භාවිත කරන ව්‍යවහාර මුදල්වන රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් සඳහන් කර ඇති විටෙක හැර, රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්නම රුපියලට වටයා ඇත.

**2.1.8 ප්‍රමාණාත්මක බව සහ සමාහරණය**

සමාන අයිතමයන්ගේ එක් එක් ද්‍රව්‍යමය පංතිය මූල්‍ය ප්‍රකාශනයන්හි සමුච්චිතව ඉදිරිපත් කර තිබේ. 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම් පිළිබඳව වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 මගින් අවසර දී ඇති පරිදි වැදගත් නොවන්නේ නම් පමණක් ස්වභාවයෙන් හෝ කර්තව්‍යයෙන් වෙනස් අයිතම වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතින විට සහ ශුද්ධ පදනම මත පියවීම සඳහා චේතනාවක් ඇති විට හෝ වගකීම් පියවීම හා වත්කම් උපලබ්ධිය එක විටම සිදුවීමේදී මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කිරීම හා ශුද්ධ අගයන් මූල්‍ය ප්‍රකාශ තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කිරීම සිදු කරයි. මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත අනාවරණයකදි හා අවශ්‍යතාවයකට හැර ආදායම් ප්‍රකාශනයේ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු නොකරයි.

**2.1.9. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන**

**(අ) විනිශ්චයන්**

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම වැදගත් බලපෑම සහිත, ඇස්තමේන්තු පිළිබඳ විනිශ්චයන් හැරුණු විට, කළමනාකාරිත්වය පහත සඳහන් විනිශ්චයන් කර තිබේ.

**(ආ) ඇස්තමේන්තු හා උපකල්පන**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තා කර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවන සැලකිය යුතු අවදානමක් සහිත අනාගතයට අදාල වැදගත් උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවේ අනෙකුත් වැදගත් මූලාශ්‍ර සැලකිල්ලට ලක් කර තිබේ.

**2.2 වත්කම්**

**වත්කම් සහ ඒවායේ තක්සේරුකිරීම් පදනම්**

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සියලු කාල සීමාවන්ට සංගතව ආදේශ කර ඇත.

**2.2.1 දේපල, පිරියත සහ උපකරණ**

**හඳුනාගැනීමේ පදනම**

අනාගත ආර්ථික ප්‍රතිලාභයක් වත්කම් තුලින් ගලා ඒම පිළිබඳව භව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි විටකදී, දේපල, පිරියත හා උපකරණ වත්කම් සේ හඳුනාගනු ලැබේ.

සියලුම දේපල, යන්ත්‍ර සහ උපකරණ මූලික පිරිවැයට වාර්තා කර ඇත. දේපල, යන්ත්‍ර සහ උපකරණ, එවැනි වත්කම්වල සම්පූර්ණ පන්තියම නැවත ඇගයීමට ලක්කරන අවස්ථාවේදි නැවත ඇගයීමට ලක් කෙරේ.

**මැනීමේ පදනම**

**(අ) පිරිවැය**

සියලු දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩු කර පිරිවැයටය. වත්කම් අත් කර ගැනීම සඳහා සෘජුව ආරෝපණීය වියදම් පිරිවැයට ඇතුලත් වේ. මණ්ඩලය විසින් ඉදිකළ වත්කම්වලට අමුද්‍රව්‍ය පිරිවැය සහ සෘජු ශ්‍රම පිරිවැය සහ අදාළ වත්කම අපේක්ෂිත පරිහරණ තත්ත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය සහ එම ඉදිකිරීමට කරන ලද වැඩ බිමෙහි යම් ඉවත් කිරීම් සහ බැහැර කිරීම් සඳහා දරන ලද පිරිවැය සහ හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලනු ලබන්නේ නම් දිගුකාලීනඉදිකිරීම් සඳහා ප්‍රාග්ධනගත කළ ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ. අනෙකුත් සියළු අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය  දරනු ලබන අවස්ථාවේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිලිගනු ලැබේ. වත්කම භාවිතයෙන් පසුව එය  භාවිතයෙන් ඉවත් කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනයක හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් අදාළ වත්කමේ පිරිවැයෙහි අන්තර්ගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටස් කාලාන්තරව ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන විටදී, ප්‍රතිස්ථාපනය කළ කොටස මණ්ඩලය ඉවත් කර නව කොටස හා  ඒ හා ආශ්‍රිත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම පිළිගනු ලැබේ. එපරිද්දෙන්ම, ප්‍රධාන පරීක්ෂාවක් සිදු කරනු ලැබීමේදී, හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම්,  එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියතේ සහ උපකරණයේ ධාරණ වටිනාකමේ හදුනාග නු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.වත්කම භාවිතයෙන් පසු එය භාවිතයෙන් ඉවත්කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනය සඳහා හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් ඒ ඒ වත්කමේ පිරිවැය ඇතුලත් කරනු ලැබේ.

**(ආ) ප්‍රත්‍යාගණනය**

වත්කම් මනිනු ලබන්නේ වත්කම මත සමුච්චිත ක්ෂයවීම සහ ප්‍රත්‍යාගණන දිනයෙන් පසු හඳුනාගනු ලබන හානි අලාභ අඩු කොට සාධාරණ වටිනාකමටය. ප්‍රත්‍යාගණනය කළ වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ගණනය කිරීම් සැලකිය යුතු වාර ගණනකින් සිදු කරනු ලැබේ.

ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක්, අනෙකුත් විස්තීර්ණ ආදායමේ කලින් හඳුනා ගනු ලැබූ එම වත්කමේම ප්‍රත්‍යාග ණන අඩුවීමක් එය  ප්‍රතිවර්තකරණ ප්‍රමාණයට හැර  අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලබන අතර, එවන් අවස්ථාවකදී වැඩිවීම අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. ප්‍රත්‍යාගණන හිඟයක්, වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ හඳුනාගනු ලබන එම වත්කම් මතම පවත්නා අතිරික්තයන් එය හිලව් කරන ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ.

වත්කමක ප්‍රත්‍යාගණනය කළ ධාරණ වටිනාකම මත පදනම් ක්ෂයවීම සහ වත්කමේ මුල් පිරිවැය පදනම් ක්ෂයවිම අතර වෙනස සඳහා වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට වාර්ෂික පැවරුමක් සිදු කරනු ලැබේ. ඊට අතිරේකව, ප්‍රත්‍යාගණන දිනයට සමුච්චිත ක්ෂයවීම වත්කමක දළ ධාරණ වටිනාකමේ ප්‍රමාණයට ඉවත් කරන අතර ශුද්ධ වටිනාකම වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට නැවත  ප්‍රකාශ කරනු ලැබේ. බැහැර කිරීමේදී, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාල  කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

සියලු දේපල, පිරියත හා උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තාකරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ තදනන්තරව ප්‍රත්‍යාගණනය කිරීමේදී, කළ හැකි  සෑම විටකදීම එවැනි වත්කම්වල සමස්ත පන්තියම ප්‍රත්‍යාග ණනය කරනු ලැබේ.

වාහන, පරිගණක හා උපාංග, කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් තදනන්තරව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ රජයේ තක්සේරුකරු වාරිකව සිදුකරන තක්සේරු පාදකව සාධාරණ වටිනාකමට දරනු

ලැබේ. පෙර තක්සේරුව 2015 වසරේ දී අවසන් කරන ලදි. මීළඟ ප්‍රත්‍යාගණනය 2022 වර්ෂයේ දී සිදුකරනු ලැබේ.

**(ඇ) ක්ෂයවීම**

ක්ෂයවීම පදනම්ව ඇත්තේ වත්කමක පිරිවැයෙන් එහි අවශේෂ වටිනාකම අඩු කිරීමෙනි. එක් එක් වත්කම්වල සැලකිය යුතු සංරචක තක්සේරු කරනු ලබන අතර යම් සංරචකයකට එම වත්කමේ ඉතිරි ඒවායින් වෙනස් ප්‍රයෝජ්‍ය ආයු කාලයක් තිබේ නම්, එම සංරචකය වෙනම ක්ෂය කරනු ලැබේ.

ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය ගණනය කරනු ලබන්නේ, සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය භාවිතා කිරීමෙන් වන අතර එසේ කරනුයේ එම වටිනාකම් ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ලියා හැරීමටය.

කල්බදු වාරය අවසානයේදී මණ්ඩලය විසින් හිමිකාරිත්වය ලබාගන්නා බවට සාධාරණ ලෙස නිශ්චිත වන්නේ නම් මිස මූල්‍ය කල්බදු යටතේ දරනු ලබන වත්කම් කල්බදු වාරයේ වඩා කෙටි වාරය සහ ඒවායේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්ෂය කරනු ලැබේ.

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය ප්‍රයෝජනය සඳහා ගත හැකි අවස්ථාවේ සිටවන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත් කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය. වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයුකාල සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේම සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය නම් පමණක් වෙනස් කරනු ලැබේ.

ජාතික ලොතරැයි මණ්ඩලයේ ක්ෂයවීම් ප්‍රතිපත්තියට අනුව වත්කමක් මිලදී ගත් මාසයේ දී ක්ෂය වන අතර බැහැර කළ මාසයේ ක්ෂයවීම් ගණනය නොකෙරේ.

පෙර වසරවල අනුපාත හා සංගත මෙම කාර්යය සඳහා යොදා ගනු ලැබූ මූලික වාර්ෂික අනුපාත පහත පරිදි වේ.

| | වාර්ෂිකව % |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 5 |
| දිනුම්ඇදීම සඳහා ගන්නා බැරල, ලොතරැයි උපකරණ | 20 |
| මෝටර් රථ | 25 |
| ගෘහභාණ්ඩ හා උපාංග | 10 |
| පරිගණක | 25 |
| වායු සමීකරණ, සාමාන්‍ය සහ කාර්යාල උපකරණ | 20 |
| ප්‍රවර්ධන උපකරණ | 33.33 |

**(ඈ) පසුකාලීන පිරිවැය**

දේපල, පිරියත හා උපකරණයක කොටස් ප්‍රතිෂ්ඨාපනය සඳහා දරන ලද පිරිවැය වත්කමේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එම කොටස හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය තුලට ලැබීමේ හව්‍යතාවයක් ඇත්නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් පමණි. පහත දී ඇති ඉවත් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රකාරව, ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටස්වල ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරීමේ පිරිවැය ඒවා දරනු ලබන විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

**(ඉ) ඉවත් කිරීම**

මුලින් හඳුනාගත් දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් සහ ඒවායේ යම් වැදගත් කොටසක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විටදී ඉවත් කරනු ලැබේ. විකිණීමේදී හෝ වත්කම ඉවත් කිරීම මත මතුවන කිසියම් ප්‍රතිලාභයක් හෝ අලාභයන් (බැහැර කිරීමෙන් ලත් ශුද්ධ මුදල් සහ වත්කම් ධාරණ වටිනාකම අතර වෙනස) වත්කම ඉවත් කරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයු කාල, ක්ෂය කිරීමේ ක්‍රම වේද සමාලෝචනය කරනු ලබන අතර, යෝග්‍ය නම් ප්‍රතිපත්ති, සම්පාදකයන් සඳහා මූල්‍ය ප්‍රකාශවල සපයා ඇති තොරතුරුවල අදාලත්වය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීම පිණිස ඉදිරිකාලීනව ගලපනු ලැබේ.

**(ඊ) පුනස්ථාපන පිරිවැය**

ආරම්භයේදී තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ නඩත්තු කිරීම පිණිස දේපල, පිරියත සහ උපකරණවල අළුත්වැඩියා හෝ නඩත්තුව සඳහා දරන ලද වියදම්, දරනු ලැබූ අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 2.2.2 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ, වත්කම පළමු උපයෝජන අවස්ථාවේදී අදාල වත්කම් ගිණුමට පවරනු ලැබේ. නොනිමි ප්‍රාග්ධන පිරිවැය යනු මිලදීගැනීමේ හෝ ඉදිකිරීමේ හා ඒ ආශ්‍රිත වෙනත් ඕනෑම වියදමක් සහිත පිරිවැය වේ.

ස්ථිර ස්වභාවයේ නොනිමි ප්‍රාග්ධන වැඩ මත හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාවය ඉහළ නැංවීම පිණිස දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් සේ සලකා තිබේ.

නොනිමි ප්‍රාග්ධන වැඩ පළමු උපයෝජන අවස්ථාවේදී හෝ වත්කම සක්‍රිය සේවය සඳහා යෙදවූ අවස්ථාවේදී අදාළ වත්කමේ ගිණුමට පවරනු ලැබේ.

### 2.2.3 අස්පෘශ්‍ය වත්කම්

**පරිගණක මෘදුකාංග**

වෙන් වෙන්ව අත්කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට මූලික හඳුනාගැනීම මත මනිනු ලැබේ. මූලික පිළිගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් කිසියම් සමුච්චිත ක්‍රමක්ෂයක් සහ සමුච්චිත හානි අලාභයක් අඩු කර පිරිවැයට ගණනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් යනු කුලිය සඳහා හෝ පරිපාලන කාර්යය සඳහා භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා දරනු ලැබූ භෞතික ද්‍රව්‍යය නොමැති හදුනාගත හැකි මූල්‍ය නොවන වත්කමකි.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනයට ආයු කාලය පරිමිත හෝ අපරිමිත සේ තක්සේරු කරනු ලැබේ.පරිමිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය මත ක්‍රමක්ෂයකරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානි වී ඇත්තේ යැයි පෙන්නුම් කිරීමක් තිබෙන කවර හෝ අවස්ථාවක හානිය අගයනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාලසීමාව සහ ක්‍රමක්ෂ ක්‍රමවේදය යටත්පිරිසෙයින් එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් වාර්ෂිකව 25% අනුපාතයට ක්‍රම ක්ෂය කරනු ලැබේ. අපේක්ෂිත ආයු කාලයේ හෝ වත්කමේ අන්තර්ගත කර ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පරිභෝජන රටාවේ වෙනස්කම් උචිත පරිදි, ක්‍රමක්ෂ කාලසීමාව හෝ ක්‍රම වේදය වෙනස් කිරීම මගින් ගිණුම්කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සේ සලකනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් මත ක්‍රමක්ෂ වියදම, අස්පෘශ්‍ය වත්කම්වල කර්තව්‍ය සමග සංගත වියදම් කාණ්ඩයේ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයන් තිබේ නම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 - 'අස්පෘශ්‍ය වත්කම්' ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිලිගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනිම නිසා ඇතිවන ලාභ හෝ අලාභ ශුද්ධ බැහැර කිරීමේ උත්පාදන සහ වත්කමේ ධාරණ මුදල අතර වෙනස ලෙස මනිනු ලබන අතර වත්කම පිළිනොගන්නා විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 2.2.4 කල්බදු වත්කම්

**කල්බදු**

කල්බදු මගින් අත්කර ගන්නා වත්කම් මනිනු ලබන්නේ ආරම්භයේදී සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත හානි අලාභ අඩු කොට, ඒවායේ සාධාරණ වටිනාකමට හෝ අවම කල්බදු ගෙවීමේ වත්මන් වටිනාකම යන ඒවායින් වඩා අඩු දේට සමාන වටිනාකමටය.

බදුහිමියාට ගෙවිය යුතු අනුරූපී මුල් මුදල බැරකමක් සේ පෙන්නුම් කරනු ලැබේ. අනාගත කාලසීමා සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය ගාස්තු සටහන්වල වෙනම හෙළිදරව් කොට ඇත.

එක් එක් වර්ෂය සඳහා අදාළ කුලී බැඳීමේ පොලී මූලිකාංගය, එක් එක් කාලසීමාව සඳහා බැරකමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තිත පොලී අනුපාතයක් නිපැයීම පිණිස බදු කාලසීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

කල්බදු දේපලට හෝ ඒ මත වැඩි දියුණු කිරීම් සඳහා පිරිවැය, කල් බද්දේ ඉතිරිව ඇති කාලසීමාව හෝ වැඩි දියුණු කිරීම්වල ප්‍රයෝජනවත් ආයු කාලය හෝ යන දෙකින් වඩා කෙටිකාලයක පුරා ප්‍රාග්ධනගත කිරීම සහ ක්ෂය කිරීම කරනු ලැබේ.

වත්කම් විකිණීමට සහ බදු ගැනීමේ ගනුදෙනුවකට අදාලව පවතින වටිනාකමට සාපේක්ෂව විකුණුම් වටිනාකමේ අතිරික්තයක් වේ නම් එම ප්‍රමාණය විලම්බිත කර බදු කාලසීමාව තුලදී ක්‍රමක්ෂය කරනු ලැබේ.

මූල්‍ය කල්බද්දක් ප්‍රතිඵලය වන්නා වූ විකිණීමත් සහ බදු ගැනීමේ ගනුදෙනුවකට අදාල වත්කම්වල ධාරණ වටිනාකම මත කවර හෝ විකුණුම් ආදායම් අතිරික්තයක් බදු වාරය පුරා විලම්බිත කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

**කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් වත්කම් බදු දීම.**

වටිනකමින් අඩු වත්කම හා කෙටිකාලින කල්බදු සදහා භාවිතා කරන වත්කම් වල කල්බදු හා කල්බදු වගකීම් වල අයිතිය හදුනා නොගැනිමට මණ්ඩලය තීරණය කර ඇත. මෙම කල්බදු හා සම්බන්ධ වන කල්බදු ගෙවීම් කල්බදු කාල සීමාව පුරාවට සරල මාර්ග පදනම යටතේ වියදමක් ලෙස මණ්ඩලය තහවුරු කරයි.

### 2.2.5 ආයෝජන දේපල

මණ්ඩලයේ කල්බදු වත්කම්වල අනුරාධපුර සහ මන්නාරම සංචාරක බංගලා අයත්වේ.

**(අ) හඳුනාගැනීමේ පදනම**

ආයෝජන දේපල යනු බදු කුලී ඉපැයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා රඳවා ගන්නා එනමුත් ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලදී විකිණීම, භාණ්ඩ හෝ සේවා නිපදවීමේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා හෝ පරිපාලනමය කාර්යය සඳහා නොවන දේපල වේ.

**(ආ) මැනීමේ පදනම**

අයිතමය හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සහ ආයෝජන දේපලේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිවීමේ හව්‍යතාවක් තිබේ නම් පමණක්ම ආයෝජන දේපල හඳුනාගනු ලැබේ. නිදහස් අයිතිය ඇති ඉඩම් සහ ගොඩනැගිලිවලින් සමන්විත, ආයෝජන දේපල යනු දිගුකාලීන කුලී සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ඒ දෙකම සඳහා රඳවාගනු ලබන දේපල වන අතර භාණ්ඩ හෝ සේවා සැපයුම සඳහා හෝ පරිපාලනය සඳහා සාරානුකූලව යොදාගනු නොලබන අතර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීමට අදහස් කරනු නොලබයි.

ආයෝජන දේපල ආරම්භයේදී සහ පසුකාලීනව ආශ්‍රිත ගනුදෙනු පිරිවැය ඇතුළුව, පිරිවැයට මනිනු ලබන අතර එබැවින් සමුච්චිත ක්ෂයවීම සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකොට පවත්වා යනු ලැබේ.

වෙළඳපොල වටිනාකම විවෘත කිරීම සඳහා මණ්ඩලයේ ආයෝජන දේපල වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකමේ වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

**(ඇ) ඉවත් කිරීම**

අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන නිසාවෙන් බැහැර කළ විටදී හෝ භාවිතයෙන් ස්ථිරවම අයින් කළ විටදී ආයෝජන දේපල ඉවත් කරනු ලැබේ.

**(ඈ) ආයෝජන දේපලවලට / දේපලවලින් පසුකාලීන පැවරුම්**

අයිතිකරුගේ අධිවාසය අවසන්වීම, වෙනත් පාර්ශ්වයකට මෙහෙයුම් බදු දීමක් ආරම්භ කිරීම හෝ විකිණීමේ අරමුණ ඇතිව ඉදිකිරීම හෝ සංවර්ධනය සම්පූර්ණ කිරීම මගින් තහවුරු වන, භාවිතයේ වෙනසක් සිදුවූ විට පමණක්ම ආයෝජන දේපලවලට පැවරුම් සිදු කරනු ලැබේ.

### 2.2.6 මූල්‍ය නොවන වත්කම් අපහායනය

සෑම වාර්තාකරණ දිනයකටම වත්කමක් හානි වී ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයි. එවැනි හානිකරණ ලක්ෂණ පවතින විට හෝ වත්කම් සඳහා හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය විට බැංකු වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. විකිණීමේදී දරන පිරිවැය අඩු කළ වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ සාධාරණ අගය සහ භාවිතා කිරීමේ වටිනාකමට වඩා වත්කමක ආපසු අය කර ගත හැකි අගය ඉහළ වේ. වත්කමක ධාරණ අගය හෝ මුදල් ජනන ඒකකය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම හානිකරණය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්මනෙහි විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ. මිලැයුම් ගුණාකාර, ප්‍රකාශිත කොටස් මිල, හෝ පවතින අනෙකුත් සාධාරණ වටිනාකම් දර්ශක මගින් මෙම ගණනය කිරීම් තහවුරු කළ යුතුය.

ප්‍රත්‍යාගණනය ස්කන්ධ කරා රැගෙන යනු ලැබූ පූර්වයෙන් ප්‍රත්‍යාගණනය කරනු ලැබූ වත්කම් හැරුණු විට, හානි වූ වත්කමේ කර්තව්‍ය හා සංගත වියදම් කාණ්ඩවල අඛණ්ඩ මෙහෙයුම්වල හානි අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එවන් අවස්ථාවකදී, පූර්වයෙන් සිදුකරන ලද කවර හෝ ප්‍රත්‍යාගණනයක වටිනාකම දක්වා හානිය ස්කන්ධයේ හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර, වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකටම ඇගයීමක් සිදු කරන අතර ඒ තුලින් පෙර හඳුනාගත් හානිකරණ අලාභ තවදුරටත් නොපවතින බවට හා ඒවා අඩුවී ඇති බවට යම් නිරීක්ෂණ කර ඇත්දැයි විමසා බලයි. එවැනි නිරීක්ෂණයක් ඇත්නම්, මණ්ඩලය විසින් වත්කමේ ආපසු අය කරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. කලින් හඳුනාගත් හානිකරණ අලාභ ප්‍රතිවර්ත කරනුයේ, අවසන් වරට හානිකරණ අලාභ හඳුනාගත් අවස්ථාවේ සිට වත්කමේ ආපසු අයකරගත හැකි අගය තීරණය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වෙනස් වේ නම් පමණි. එය එසේ වන්නේ නම්, වත්කමේ ධාරණ අගය එහි ආපසු අය කරගත හැකි වටිනාකමට ඉහළ නංවනු ලැබේ.

පෙර වසරවලදී වත්කම සඳහා හානි අලාභයක් හඳුනාගෙන නොමැති නම්, එම වැඩිකල වටිනාකමට ක්ෂයවීම නොමැතිව නිශ්චය කිරීමට ඉඩ තිබූ ධාරණ වටිනාකම ඉක්මවා යාමට නොහැක. වත්කම ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට පවත්වා නොගන්නේ නම් මිස, එබඳු ප්‍රතිවර්තනයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා අතර එබඳු අවස්ථාවකදී ප්‍රතිවර්තනය, ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ.

**2.2.7 විකිණීම සඳහා රඳවා ගත් ජංගම නොවන වත්කම්**

විකිණීම සඳහා ඇති වත්කම්වල ධාරණ වටිනාකම මූලිකවම විකුණුම් ගනුදෙනුවක් හරහා අය කර ගැනීමට නියමිත විටදී හා විකුණුම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවක් ඇතැයි සලකනු ලබන විටදී ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගිකරණය කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩුකොට ධාරණ වටිනාකම සහ සාධාරණ අගය යන දෙකින් වඩා අඩු දෙයට එය සඳහන් කරනු ලැබේ.

ජංගම නොවන වත්කම් සහ බැහැර කරන කාණ්ඩ විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ විකිණීම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවයක් ඇති විටදී සහ වත්කම හෝ බැහැර කරන කාණ්ඩය එහි වත්මන් තත්ත්වයෙන් වහාම විකිණීම සඳහා පවතින විටදී පමණි.දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කිරීමෙන් පසුව ක්ෂය කිරීම හෝ ක්‍රමක්ෂණ කිරීම කරනු නොලැබේ.

**2.2.8 මූල්‍ය වත්කම්**

**SLFRS 9 – මූල්‍ය උපකරණ: වර්ගීකරණය සහ මිණුම්**

2014 දී නිකුත් කරන ලද SLFRS 9, LKAS 39 මූල්‍ය උපකරණ: වර්ගීකරණය සහ මිනුම් මගපෙන්වීම ප්‍රතිස්ථාපනය කරයි. මූල්‍ය වත්කම් වල හානිය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය පාඩු ආකෘතියක් සහ නව සාමාන්‍ය හෙජ් ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළුව මූල්‍ය උපකරණ වර්ගීකරණය හා මැනීම පිළිබඳ සංශෝධිත මගපෙන්වීමක් SLFRS 9 ට ඇතුළත්වේ. LKAS 39 වෙතින් මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ හඳුනාගැනීම පිළිබඳ මගපෙන්වීම ද එය ඉදිරියට ගෙනයයි.

වත්කම අත්පත් කරගත් කාර්යය මත පරායත්ත වූ මණ්ඩලය සිය මූල්‍ය වත්කම් පහත සාකච්ඡා කර ඇති කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කරනු ලැබේ. එක් එක් කාණ්ඩ සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිපත්ති පහත පරිදි වේ.

**(අ). වෙළඳ ලැබීම්**

සක්‍රිය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හා සේවා සැපයීම හරහා ඒවා මූලිකවම මතුවන නමුත් (උදා : වෙළඳ ලැබිය යුතු දෑ) අනෙකුත් ආකාරයේ ගිවිසුම්කර මූල්‍ය වත්කම් ද එයට අන්තර්ගත වේ. සාධාරණ වටිනාකමට සහ ඒවා අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණීය ගනුදෙනු පිරිවැයට ඒවා පළමුව හඳුනාගනු ලැබේ.

**(ආ).වෙනත් ජංගම වත්කම්**

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මූලිකවම මනිනු ලබන්නේ පිරිවැයටය.

**ඇ). බොල් ණය සඳහා ප්‍රතිපාදන**

බැංකු ඇපකරවල වටිනාකම අඩුකර එක් එක් අයගේ ණය ප්‍රමාණය මත පහත සඳහන් ආයු කාල විශ්ලේෂණය මත ආරක්ෂිත වෙළඳ ණයගැතියන් මත වූ බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

| ණය කාල සීමාව | ප්‍රතිශතය (%) |
|---|---|
| **සක්‍රිය ණය ගැතියන්** | |
| මාස 0-3 දක්වා | -ප්‍රතිපාදන නැත |
| මාස 4-6 දක්වා | -2.5% |
| මාස 7-12 දක්වා | -5% |
| මාස 12ට වැඩි | -10% |
| **අක්‍රිය ණය ගැතියන්** | |
| නීතිමය නඩු සහ වෙනත් ආරවුල් යටතේ ණය ගැතියන් | -100% |

**2.2.9 තොග**

නිෂ්පාදනයේ කෙටි ජීවන චක්‍රය හේතු කොටගෙන ශුද්ධ උපලබ්ධි අගයක් නොමැතිවීම නිසා යල්පිනූ සහ සෙමින් විකිණෙන අයිතම සඳහා නිසි වාසි ලබාදීමෙන් අනතුරුව, වට්ටෝරු භාණ්ඩ පිරිවැයට පමණක් මනිනු ලැබේ. ලොතරැයිපත් වේගයෙන් අලෙවි වන බැවින් ශුද්ධ උපලබ්ධි අගය හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට වට්ටෝරු භාණ්ඩ විකිණිය හැකි මිලය.

රන් භාණ්ඩ, මෝටර් රථ සහ අනෙකුත් ත්‍යාග ඇතුළත් ත්‍යාග තොග, ඒවාට විකුණුම් වටිනාකමක් නොමැති බැවින් සහ දරන ලද වියදම පමණක් ඇති බැවින් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. එවැනි සියලු තොග අනාගතයේ ඕනෑම වේලාවක ත්‍යාග ලෙස පිරිනමනු ලබන මුත් 'අතේ දුරිනී' ගනුදෙනුවක් මගින් විකුණනු නොලැබේ.

වට්ටෝරු භාණ්ඩ ඒවා වත්මනෙහි තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය වට්ටෝරු භාණ්ඩ පිරිවැය ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

**2.2.10 මුදල් හා මුදලට සමාන දෑ**

මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් සහ ඉල්ලුම් තැන්පතු ලෙස නිර්වචනය කෙරේ. අතැති මුදල්, ඉල්ලූ විට ලබාගැනීම සඳහා බැංකුවේ රඳවා ඇති තැන්පතු, මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඊට ඇතුලත් වේ.

වක්‍ර ක්‍රමය මත පාදකව මුදල් ප්‍රවාහ ප්‍රකාශ වාර්තා කරනු ලැබේ.

**2.2.11 SLFRS 13 සාධාරණ අගය මත මැනීම**

ශ්‍රී. ලං. මු. වා. ප්‍ර. 13 සාධාරණ අගය මත මැනීම් ශ්‍රී. ලං. මු. වා. ප්‍ර. අනුව පුනරාවර්තන හා පුනරාවර්තන නොවන පදනම හා යොදාගන්නා ලද තක්සේරු ක්‍රමවේද මත වත්කම් හා වගකීම්වල සාධාරණ අගය ගණනය කර ඇත.

අනෙකුත් ජංගම වත්කම්වල හා වගකීම්වල සාධාරණ අගය පිරිවැය මත පෙන්වුවද ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වන කොළඹ ගුවන්තොටුපළ ලොතරැයිය යන ලොතරැයිවල සටහන් අංක 16-1 පරිදි විනිමය හුවමාරු අගයන් ද සැලකිල්ලට ගෙන පෙන්වා ඇත.

## 2.3 ස්කන්ධ ප්‍රාග්ධනය, වගකීම් හා ප්‍රතිපාදන

### 2.3.1 ස්කන්ධ ප්‍රාග්ධනය

**සම්මුචිත භාණ්ඩාගාර අරමුදල**

මෙය මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වා දුන් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය කරයි.

**ප්‍රත්‍යාගණනය කළ සංචිතය**

රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් සිදු කරන ලද දේපල, යන්ත්‍ර හා උපකරණ නැවත ප්‍රත්‍යාගණනයේ ශුද්ධ ප්‍රත්‍යාගණිත ලාභය ප්‍රත්‍යාගණන සංචිත තුළින් නියෝජනය කරයි.

**ගොඩනැගිලි සංචිත අරමුදල**

යෝජිත ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම් අවශ්‍යතාවය සඳහා අවශ්‍ය අරමුදල් උත්පාදනය කිරීමේ හා ප්‍රයෝජනයට ගැනීම සඳහා ගොඩනැගිලි සංචිත අරමුදල පිහිටුවා ඇත.

**ත්‍යාග සංචිත අරමුදල**

ලොතරැයිවල සුපිරි ත්‍යාග සහ විශේෂ දිනුම්වාරවල ත්‍යාග පිරිනැමීම සඳහා මණ්ඩලය විසින් ත්‍යාග සංචිත අරමුදල පවත්වාගෙන යනු ලබයි.

**රඳවාගත් ඉපැයීම්**

මෙයින් මෙහෙයුම්වල බදු පසු සමුච්චිත ශුද්ධ අතිරික්තය නියෝජනය කරයි.

### 2.3.2 බැරකම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ශේෂපත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවීමට සිදු වේ යැයි අපේක්ෂා කරන බැරකම් වේ. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී දන්නා සියලුම බැරකම් ගිණුම්ගත කොට ඇත.

වෙළඳ ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායේ පොත් වටිනාකමට සඳහන් කර ඇත.

### 2.3.3 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය බැරකම්

**වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැඳීමක් (නෛතික සහ සම්මුතික) මණ්ඩලය සතුවීමදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

### 2.3.4 ආදායම් බදු වියදම

ආදායම් බදු වියදම් වර්තමාන බදු සහ විලම්බිත බදු වලින් සමන්විත වේ. ප්‍රාග්ධනයෙන් සෘජුවම පිළිගත් අයිතමවලට අදාළ නම්,එය කොටස් වශයෙන් පිළිගනු ලබන ප්‍රමාණයට හැර ආදායම් බදු වියදම ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ සෘජුවම හඳුනා ගැනේ.

**ජංගම බදු**

මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධන ප්‍රකාරව ගණනය කර ඇත. ඒකාබද්ධ අරමුදලට කරන ලද දායක මුදල් මත ගෙවිය යුතු / ගෙවන ලද ආදායම් බදු අදාළ බලධාරීන් සමඟ එකඟවූ පරිදි අනාගත ප්‍රේෂණයන්ගෙන් අදාළ අරමුදලට වාරික වශයෙන් අයකර ගනු ලැබේ.

**විලම්බිත බදු**

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රම වේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් හඳුනාගනු ලැබේ. සියලු අඩුකළ හැම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන ගිය ප්‍රයෝජනයට නොගත් බදු බැර සහ ප්‍රයෝජනයට නොගත් බදු අලාභ සඳහා බදු අයකළ හැකි ලාභය පැවතීමට ඉඩ ඇති ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ වටිනාකම එක් එක් ශේෂපත්‍ර දිනයට සමාලෝචනය කරනු ලබන අතර විලම්බිත බදු සියල්ල හෝ‍ඉන් කොටසක් ප්‍රයෝජනයට ගනු ලැබීමට ඉඩදීම පිණිස ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයක් පැවතීමට තවදුරටත් භව්‍යතාවයක් නොමැති ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශයේ එක් එක් දිනට ප්‍රති තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම් නැවත අය කර ගැනීමට ඉඩදීමට හැකි වන ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්භිත බදු වත්කම් හෝ බැරකම් මනිනු ලබන්නේ පනවනු ලැබ ඇති හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් දිනට සාරානුකූලව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි කළ හෝ බැරකම පියවනු ලැබූ අවස්ථාවේ එම වසරට අදාළ කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයන්ටය.

ආදයම් බදු වියදම කාරක ප්‍රාග්ධනයට සෘජුවම සම්බන්ධ අයිතමවලට හැර ලාභ අලාභ ප්‍රකාශයේ සෘජුවම වියදමක් ලෙස හදුනා ගැනේ.

## 2.4. සේවක ප්‍රතිලාභ

### 2.4.1. කෙටි කාලීන - සේවක ප්‍රතිලාභ

වැටුප්,දිරි දීමනා, ප්‍රවාහන දීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා , වෛද්‍ය පහසුකම් , නිල ඇඳුම් දීමනාව, ලොතරැයි දිනුම් ඇදීමේ දීමනා,අවදානම් දීමනා,අතිකාල දීමනා හා ආහාර සැපයීම්.

### 2.4.2. දිගු කාලීන - සේවක ප්‍රතිලාභ

ආපදා ණය, නිවාස ණය

## 2.4.3. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**(අ) නිර්වචිත දායක සැලසුම් - සේ.අ.අ. සහ සේ.භා.අ.**

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා හිමිකම් ලබා ඇති සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වචිත දායක සැලසුම් සඳහා දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.සේ.අ.අ. සඳහා සේවකයන්ගේ දායකත්වය 10% වන අතර මණ්ඩලය විසින් වැටුපෙන් 15% සපයයි. සේ.භා.අ. සඳහා මණ්ඩලය විසින් 3% සපයයි.

**(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය**

පාරිතෝෂිකය යනු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. මෙම වගකීම ඉටු කිරීම සඳහා ප්‍රතිපාදනයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරියට ගෙන යනු ලැබේ. ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් විසින් නිර්දේශ කර ඇති පරිදි ආයුගණක තක්සේරුවක් මත පදනම්ව මෙම ප්‍රතිපාදනය සිදු කර ඇති අතර එම කාලසීමාව සඳහා වාර්කය ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස අය කෙරේ. ආයුගණක තක්සේරුව වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු විසින් සිදු කරනු ලබන අතර සෑම වසරකම ආයුගණක තක්සේරුව සිදු කිරීමට මණ්ඩලය අපේක්ෂා කරයි. අරමුදලට බාහිරව අරමුදල් සපයන්නේ නැත.

කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, වගකීම ආරම්භ වන්නේ අඛණ්ඩ සේවා කාලය වසර පහක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

**2.5 ආදායම් ප්‍රකාශනය**

**2.5.1 ආදායම හඳුනාගැනීම**

ජාතික ලොතරැයි මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු සඳහා පාරිභෝගිකයින් සමග ගිවිසුම් ගත වීමක් අවශ්‍ය නොවන අතර එය සාමාන්‍ය විකිණීමකි.

(අ) **SLFRS 15 - ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම් වලින් ලැබෙන ආදායම**

SLFRS 15 ආදායම හඳුනාගෙන තිබේ ද, කොපමණද, කවදා ද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් ස්ථාපිත කරයි. LKAS 18 ආදායම, LKAS11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ IFRIC 13 පාරිභෝගික පක්ෂපාතිත්ව වැඩසටහන් ඇතුළුව පවත්නා ආදායම් හඳුනාගැනී මේ මාර්ගෝපදේශය එය ප්‍රතිස්ථාපනය කරයි.

(ආ) **පොළිය**

කාල පදනමක් මත උපචිත වන සඵල පොලී ක්‍රම වේදය යොදා ගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

(ඇ) **වෙනත්**

අනෙකුත් ආදායම උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

**2.5.2 වියදම හඳුනාගැනීම**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලබන්නේ දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම්වල ඉපැයුම් අතර සෘජු සම්බන්ධය පදනම් කරගෙනය. එලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපළ, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමට දැරීමට සිදුවූ සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

**2.5.3. රජයේ දායක මුදල් සඳහා ගෙවීම් (විශේෂ බද්ද)**

1971 අංක 38 දරණ මුදල් පනතේ (9)(2)(ඊ) පරිච්ඡේදය අනුව රජයේ දායක මුදල් සඳහා (විශේෂ බද්ද) කරන ගෙවීම් හෝ රජයට කරන ගෙවීම් මුදල් අමාත්‍යවරයා විසින් වරින් වර තීරණය කරනු ලබන ප්‍රමාණය අනුව මණ්ඩලයේ ශුද්ධ ආදායම ගණනය කිරීමේදී ආදායමට එරෙහිව ගලපන ලදි.

**2.6 සාමාන්‍ය කරුණු**

**2.6.1. වාර්තා කරන දිනට පසු සිදු වූ සිදු වීම්**

වාර්තා කරන දිනට සිදු වූ පැන නැඟුණු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලන ලද අතර අවශ්‍ය අවස්ථාවන්හිදී ගැලපීම හෝ හෙළිදරව් කිරීම කර මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල දක්වා ඇත.

**2.6.2. සංසන්දනාත්මක දත්ත**

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය තැන්වලදී සංසන්දනාත්මකව නැවත වර්ගීකරණය කර දක්වා ඇත.

**2.6.3. ණය සහ ලැබිය යුතුදේ**

- නිවාස ණය - අවුරුදු 07ක මූලික වැටුප (උපරිමය රු. 3,000,000/= දක්වා ).පොළී අනුපාතය 4% වයස අවුරුදු 55 දක්වා අය කර ගැනීම.

- ආපදා ණය - මාස 10 මූලික වැටුප (උපරිමය රු. 250,000/= දක්වා ). පොළී අනුපාතය 4.2% මාසික වාරික 60 කින් අය කර ගැනීම.

**2.6.4. බැදීම් සහ අසම්භාව්‍ය වගකීම්**

අසම්භාව්‍ය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වත්මන් වගකීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කළ හැකි බැදීම් වේ. මණ්ඩලයේ ප්‍රාග්ධන වගකීම් සහ අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

**2.6.5. හිමිකම් නොපෑ ත්‍යාග**

අදාළ දිනුම් ඇදීමේ දින සිට මාස හයකට පසු හිමිකම් නොපෑ ත්‍යාග අහිමි වන අතර එය කාර්තුමය පදනමින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

**2.6.6. අරමුදල් බෙදාහැරීම**

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ මණ්ඩලය විසින් 2008 සැප්තැම්බර් 02 දින සිට බලපැවැත්වෙන පරිදි ටිකට්පතක මිල රු. 10.00 සිට රු. 20.00 දක්වා වැඩිකරන ලදි. ඒ අනුව නියෝජිත කොමිස් ද 15% සිට 17.5% දක්වා වැඩිවිය. තවද 2019 ජූලි 01 මාසයේ සිට නියෝජිත කොමිස් ද 17.5% සිට 18.75% දක්වා වැඩිවිය.

**(අ). දිනුම් අදින ලොතරැයිවලට අදාළ අරමුදල් බෙදාහැරීම පහත පරිදි වේ.**

| | මහජන සම්පත | වාසනා සම්පත | ගොවිසෙත | සුපිරි වාසනා | ජාතික සම්පත | ධන නිධානය | සම්පත ලග්න වරම | | මෙගා පවර් | සෙවණ දිනුම් අදින | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 20/- | 30/- | | | |
| ත්‍යාග | 49% | 52% | 47% | 52% | 52% | 47% | 49% | 52% | 48% | 49% | 52% |
| නියෝජිත කොමිස් | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% |
| රජයට දායකත්වය | 16.50% | 16.50% | 10% | 10% | 10% | 10% | 10% | 10% | 10% | 10% | 10% |
| මණ්ඩලීය වියදම් | 15.75% | 12.75% | 24.25% | 19.25% | 19.25% | 24.25% | 22.25% | 19.25% | 23.25% | 22.25% | 19.25% |
| එකතුව | 100% | 100% | 100% | 100% | 100% | 100% | 100% | 100% | 100% | 100% | 100% |

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා සමාගම වෙනුවෙන් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ඩොලර් ෆෝචූන් ලොතරැයිය පවත්වයි. ශුද්ධ අතිරික්තය (විශේෂ බදු) ඒකාබද්ධ අරමුදල හරහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා සමාගම වෙත බැර කරනු ලැබේ.

**ආ) ක්ෂණික ලොතරැයිවලට අදාළ අරමුදල් බෙදා හැරීම**

| | **රු.20/- සෙවණ** | **රු.50/- සෙවණ** | **රු.20/- සමෘද්ධි** |
|---|---|---|---|
| ත්‍යාග | 53% | 53% | 49% |
| නියෝජිත කොමිස් | 18.75% | 18.75% | 18.75% |
| රජයට දායකත්වය | 10% | 10% | 10% |
| මණ්ඩලීය වියදම් | 18.25% | 18.25% | 22.25% |
| එකතුව | 100% | 100% | 100% |

**(ඇ)** රජයට කරන දායකත්වය ලෙස ඒකාබද්ධ අරමුදලට හා ජාතික වකුගඩු අරමුදලට ඒකාබද්ධ අරමුදල හරහා පහත සඳහන් ප්‍රතිශතයන් පරිදි අදාළ අමාත්‍යංශ වලට දායකත්වය ලබාදෙන ලදී.

| **දිනුම් ඇදීන ලොතරැයි** | **ප්‍රතිශතය (%)** | **ඒකාබද්ධ අරමුදල/අමාත්‍යාංශ** |
|---|---|---|
| මහජන සම්පත | 16.5% | ඒකාබද්ධ අරමුදල |
| වාසනා සම්පත | 16.5% | ඒකාබද්ධ අරමුදල |
| ගොවිසෙත | 10% | ඒකාබද්ධ අරමුදල - කෘෂිකර්ම අමාත්‍යංශය |
| සුපිරි වාසනා(අඟහරුවාදා) | 10% | ඒකාබද්ධ අරමුදල - රණවිරු සේවා අධිකාරිය |
| සුපිරි වාසනා (සිකුරාදා සහ ඉරිදා) | 10% | ඒකාබද්ධ අරමුදල - ක්‍රීඩා හා සමාජසේවා අමාත්‍යාංශය |
| ජාතික සම්පත (සඳුදා සහ බදාදා) | 10% | ඒකාබද්ධ අරමුදල - සෞඛ්‍ය අමාත්‍යාංශය හා දේශීය වෛද්‍ය අමාත්‍යාශය |
| ජාතික සම්පත (බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා) | 10% | ඒකාබද්ධ අරමුදල - කම්කරු අමාත්‍යාශය |
| සම්පත ලග්න වරම | 10% | ජාතික වකුගඩු අරමුදල |
| මෙගා පවර් | 10% | ඒකාබද්ධ අරමුදල |
| සෙවණ දිනුම් ඇදීන | 10% | ඒකාබද්ධ අරමුදල - සෙවණ අරමුදල |
| ධන නිධානය | 10% | ඒකාබද්ධ අරමුදල |
| දරු දිරි සම්පත | 10% | ඒකාබද්ධ අරමුදල - ජාතික භාරකාර අරමුදල (ළමා ආරක්ෂාව සඳහා) |
| **ක්ෂණික ලොතරැයි** | **ප්‍රතිශතය (%)** | **ඒකාබද්ධ අරමුදල/අමාත්‍යාංශ** |
| සෙවණ | 10% | ඒකාබද්ධ අරමුදල - නිවාස අමාත්‍යාංශය |
| සමෘද්ධි | 10% | ඒකාබද්ධ අරමුදල - සමෘද්ධි හා තරුණ කටයුතු |

**2.6.7. ත්‍යාග ගිණුම්ගත කිරීම**

1997 අංක 35 දරණ (සංශෝධිත) මුදල් පනතේ 5(1) පරිච්ඡේදය අනුව සහ 1998 අංක 22 දරණ (සංශෝධිත) මුදල් පනතේ අංක 7(2) පරිච්ඡේදයේ සඳහන නීති ප්‍රකාරව අදාළ දිනුම්වාරයේ දිනා නොගත් ත්‍යාගවල වටිනාකම ඉන්පසු දිනුම් ඇදීන ලොතරැයි වාරවල ත්‍යාග ගෙවීම සඳහා යොදා ගැනීමට මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ත්‍යාග සංචිත ගිණුමට බැර කර එකතු කරයි.

**2.6.8. ඩොලර් ෆෝචූන් ලොතරැයිය**

ඩොලර් ෆෝචූන් ලොතරැයිය සම්පත් බැංකුව හරහා අන්තර්ජාලය හරහා ද අලෙවි කෙරේ.

**2.6.9. ඊ-ලොතරැයිය**

දිනුම් අදින ලොතරැයි සාමාන්‍ය අලෙවි නියෝජිත ජාලයට අමතරව SMS මගින් අලෙවි කෙරේ.

**2.6.10. ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු හා වැරදිවල වෙනස්කම්**

පහත සංශෝධිත ප්‍රමිතීන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

ශ්‍රී. ලං. මු. රෙ. ප්‍ර. 03 - ව්‍යාපාර සම්බන්ධිතයන් ( ව්‍යාපාර සඳහා නිර්වචනය)
ශ්‍රී. ලං. මු. රෙ. ප්‍ර. 17 - රක්ෂණ ගිවිසුම්

| සටහන් 03 - දළ පිරිවැටුම - එකතුකළ අගය මත බදු (VAT) ඇතුලත්ව | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| මහජන සම්පත | 6,475,960,400 | 5,760,190,600 |
| වාසනා සම්පත | 182,867,800 | 408,506,000 |
| ගොවිසෙත | 4,441,618,920 | 5,290,655,920 |
| සුපිරි වාසනා | 451,990,600 | 410,341,720 |
| ජාතික සම්පත | 562,273,960 | 629,895,000 |
| නීරෝගා | - | 424,575,200 |
| මෙගා පවර් | 2,233,985,800 | 3,182,546,200 |
| සෙවණ දිනුම් අදින | 123,994,300 | 357,043,680 |
| ධන නිධානය | 2,370,481,000 | 1,122,022,320 |
| දරු දිරි සම්පත | 54,539,200 | 186,557,160 |
| සම්පත ලග්න වරම | 143,216,100 | - |
| මහජන සම්පත ජනාභිෂේක | - | 91,249,200 |
| සමෘද්ධි | 30,000,000 | - |
| සෙවණ - ක්ෂණික | 221,138,000 | 157,562,000 |
| විශේෂ - ක්ෂණික | - | 20,000,000 |
| | 17,292,066,080 | 18,041,145,000 |

| සටහන් 04 - විකුණුම් පිරිවැය | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 425,035,522 | 443,032,509 |
| අලෙවි නියෝජිත කොමිස් | 3,242,262,390 | 3,382,714,688 |
| දිස්ත්‍රික් අලෙවි නියෝජිත කොමිස් | 215,375,258 | 225,292,990 |
| ත්‍යාග | 8,352,173,636 | 8,667,549,257 |
| රජයට දායකත්වය (විශේෂ බදු) | 2,162,030,441 | 2,205,079,779 |
| | 14,396,877,247 | 14,923,669,223 |

| සටහන් 04 -01 ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| ජනවාරි 01 දිනට ආරම්භක තොග ශේෂය | | |
| දිනුම් අදින ලොතරැයි | 5,720,695 | 1,181,368 |
| සෙවණ ලොතරැයිය | 1,400,473 | 3,666,784 |
| විශේෂ - ක්ෂණික | 1,168,265 | 1,168,265 |
| | 8,289,433 | 6,016,417 |
| එකතු කළා: වර්ෂය තුළ ටිකට්පත් මිලදී ගැනීම් | 420,408,641 | 445,305,525 |
| | 428,698,074 | 451,321,942 |
| අඩු කළා: දෙසැම්බර් 31 දිනට අවසාන තොග ශේෂය | | |
| දිනුම් අදින ලොතරැයිය | 2,996,666 | 5,720,695 |
| සෙවණ ලොතරැයිය | 665,886 | 1,400,473 |
| විශේෂ - ක්ෂණික | - | 1,168,265 |
| | 3,662,552 | 8,289,433 |
| | 425,035,522 | 443,032,509 |

| සටහන් 04-02-නියෝජිත කොමිස් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| මහජන සම්පත | 1,214,242,575 | 1,080,035,738 |
| වාසනා සම්පත | 34,287,713 | 76,594,875 |
| ගොවිසෙත | 832,803,548 | 991,997,985 |
| සුපිරි වාසනා | 84,748,238 | 76,939,073 |
| ජාතික සම්පත | 105,426,368 | 118,105,313 |
| නීරෝගා | - | 79,607,850 |
| මෙගා පවර් | 418,872,338 | 596,727,413 |
| සෙවණ දිනුම් අදින | 23,248,931 | 66,945,690 |
| ධන නිධානය | 444,465,188 | 210,379,185 |
| දරු දිරි සම්පත | 10,226,100 | 34,979,468 |
| සම්පත ලග්න වරම | 26,853,019 | - |
| මහජන සම්පත ජනාභිෂේක | - | 17,109,225 |
| සමෘද්ධි | 5,625,000 | - |
| සෙවණ - ක්ෂණික | 41,463,375 | 29,542,875 |
| විශේෂ - ක්ෂණික | - | 3,750,000 |
| **එකතුව** | 3,242,262,390 | 3,382,714,688 |

| සටහන් 04-03-දිස්ත්‍රික් නියෝජිත කොමිස් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| මහජන සම්පත | 80,911,835 | 72,088,011 |
| වාසනා සම්පත | 2,285,783 | 5,106,553 |
| ගොවිසෙත | 55,460,228 | 66,180,261 |
| සුපිරි වාසනා | 5,649,641 | 5,146,834 |
| ජාතික සම්පත | 7,027,947 | 7,894,587 |
| නීරෝගා | - | 5,320,647 |
| මෙගා පවර් | 27,913,719 | 39,810,660 |
| සෙවණ දිනුම් අදින | 1,549,895 | 4,475,951 |
| ධන නිධානය | 29,623,509 | 14,045,923 |
| දරු දිරි සම්පත | 681,743 | 2,329,713 |
| සම්පත ලග්න වරම | 1,759,580 | - |
| මහජන සම්පත ජනාභිෂේක | - | 1,118,232 |
| සමෘද්ධි | 300,000 | - |
| සෙවණ - ක්ෂණික | 2,211,380 | 1,575,620 |
| විශේෂ - ක්ෂණික | - | 200,000 |
| **එකතුව** | 215,375,258 | 225,292,990 |

| සටහන් 04-04 - ත්‍යාග | **2021** **රු.** | 2020 රු. |
|---|---|---|
| මහජන සම්පත | 3,142,710,614 | 2,822,550,384 |
| වාසනා සම්පත | 90,518,482 | 191,997,900 |
| ගොවිසෙත | 2,181,733,226 | 2,486,664,462 |
| සුපිරි වාසනා | 227,523,780 | 197,350,059 |
| ජාතික සම්පත | 268,924,496 | 296,051,110 |
| නීරෝගා | - | 208,042,128 |
| මෙගා පවර් | 966,214,913 | 1,527,872,740 |
| සෙවණ දිනුම් අදින | 58,360,510 | 174,953,023 |
| ධන නිධානය | 1,181,685,270 | 527,350,950 |
| දරු දිරි සම්පත | 28,881,503 | 87,684,655 |
| මහජන සම්පත ජනාභිෂේක | - | 52,924,236 |
| මහජන සම්පත ජනාභිෂේක-විශේෂ ත්‍යාග ගෙවීම | 2,234,600 | - |
| සම්පත ලග්න වරම | 71,483,102 | - |
| සමෘද්ධි | 14,700,000 | - |
| සෙවණ - ක්ෂණික | 117,203,140 | 83,507,610 |
| විශේෂ - ක්ෂණික | - | 10,600,000 |
| **එකතුව** | 8,352,173,636 | 8,667,549,257 |

| සටහන් 04-05-රජයට කරන ලද දායකත්වය (විශේෂ බදු) | **2021** **රු.** | 2020 රු. |
|---|---|---|
| **ඒකාබද්ධ අරමුදලට ගෙවීම්** | | |
| මහජන සම්පත | 1,068,533,466 | 950,431,449 |
| වාසනා සම්පත | 30,173,187 | 67,403,490 |
| ගොවිසෙත | 444,161,892 | 529,065,592 |
| සුපිරි වාසනා | 45,199,060 | 41,034,172 |
| ජාතික සම්පත | 56,227,396 | 62,989,500 |
| මෙගා පවර් | 223,398,580 | 318,254,620 |
| සෙවණ දිනුම් අදින | 12,399,430 | 35,704,368 |
| ධන නිධානය | 237,048,100 | 112,202,232 |
| දරු දිරි සම්පත | 5,453,920 | 18,655,716 |
| මහජන සම්පත ජනාභිෂේක | - | 9,124,920 |
| මහජන සම්පත රන් කිරුළ | 3,000,000 | - |
| සෙවණ - ක්ෂණික | 22,113,800 | 15,756,200 |
| විශේෂ - ක්ෂණික | - | 2,000,000 |
| | 2,147,708,831 | 2,162,622,259 |
| **වකුගඩු අරමුදල සඳහා කරන ලද දායකත්වය** | | |
| නීරෝගා | - | 42,457,520 |
| සම්පත ලග්න වරම | 14,321,610 | - |
| | 14,321,610 | 42,457,520 |
| | 2,162,030,441 | 2,205,079,779 |

| සටහන් 05-වෙනත් ආදායම් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| පොළී ආදායම | 332,969,241 | 353,365,849 |
| වෙනත් ආදායම් | 83,053,410 | 69,552,244 |
| **එකතුව** | 416,022,651 | 422,918,093 |

| සටහන් 06 - විකුණුම් අලෙවි හා බෙදාහැරීම් වියදම් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| බෙදාහැරීම් වියදම් | 146,651,612 | 145,937,122 |
| විකුණුම් අලෙවි හා බෙදාහැරීම් වියදම් | 900,376,746 | 724,055,511 |
| සන්නිවේදන වියදම් | 27,074,560 | 23,009,810 |
| **එකතුව** | 1,074,102,918 | 893,002,443 |

| සටහන් 06-01-බෙදාහැරීම් වියදම් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| මෝටර් වාහන - ඉන්ධන | 10,957,970 | 8,853,598 |
| මෝටර් වාහන - අළුත්වැඩියාව හා නඩත්තුව | 6,221,074 | 3,684,330 |
| මෝටර් වාහන - රක්ෂණ | 791,008 | 1,315,098 |
| මෝටර් වාහන - ආදායම් බලපත්‍ර | 248,221 | 270,313 |
| මෝටර් වාහන - ටයර් හා ටියුබ් | 2,042,892 | 1,030,640 |
| මෝටර් වාහන - නඩත්තු හා වෙනත් | 4,353,213 | 3,121,509 |
| මෝටර් වාහන - ක්ෂය කිරීම් | 7,981,885 | 10,767,230 |
| ටිකට්පත් ප්‍රවාහන වියදම් | 15,251,018 | 10,194,098 |
| නියෝජිත සහන වියදම් හා ආපසු භාරදෙන ටිකට්පත්වල පිරිවැය | 209,326 | 43,963 |
| දි. නියෝජිත හා අලෙවි නියෝජිත පුහුණු වියදම් හා රැස්වීම් | 2,197,855 | 772,100 |
| නියෝජිතයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය | 670,500 | 19,500 |
| නියෝජිත සහ අලෙවි සහායක වෛද්‍ය හා රක්ෂණ වියදම් | 5,913,000 | 4,932,000 |
| නියෝජිත අතිරේක අලෙවි ප්‍රවර්ධන වියදම් | 35,618,109 | 53,761,862 |
| දිනුම්ලාභීන් බිහිකළ අලෙවි නියෝජිතවරු ඇගයීම | 1,970,000 | 2,288,000 |
| අලෙවි නියෝජිත සහ අලෙවි සහායක සහන - කොවිඩ් 19 | 51,867,500 | 42,760,006 |
| අසරණ සරණ අරමුදල සඳහා ගෙවීම් (සම්පත ලග්න වරම /නීරෝගා දිරි දිමනාව) | 358,040 | 2,122,876 |
| | 146,651,612 | 145,937,122 |

| සටහන් 06-02-අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| නිෂ්පාදන හා විකාශන ගාස්තු | 366,642,160 | 385,411,583 |
| ලොතරැයි ප්‍රතිඵල ප්‍රචාරණය | 84,678,899 | 92,796,523 |
| වෙළඳනාම ප්‍රවර්ධන ප්‍රචාරණය | 345,359,984 | 134,279,982 |
| ප්‍රතිරූප ප්‍රවර්ධන ප්‍රචාරණය | 73,049,703 | 49,847,273 |
| ආයතනික සමාජීය වගකීම් | 15,689,000 | 24,888,075 |
| BTL ප්‍රචාරණ වියදම් | - | 27,264,975 |
| මහජන සම්බන්ධතා වියදම් | 3,157,000 | 4,531,100 |
| අලෙවි නියෝජිතයින්ට අලෙවි කුටි හා වෙනත් දේ | 11,800,000 | 5,036,000 |
| **එකතුව** | 900,376,746 | 724,055,511 |

| සටහන් 06 -03 - සන්නිවේදන වියදම් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| තැපැල් හා විදුලි පණිවිඩ | 74,277 | 62,085 |
| දුරකථන, ෆැක්ස් හා අන්තර්ජාල | 12,699,197 | 12,194,098 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 13,533,276 | 10,124,684 |
| පුවත්පත් දැන්වීම් | 767,811 | 628,943 |
| එකතුව | 27,074,560 | 23,009,810 |

| සටහන් 07- පරිපාලන වියදම් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| සේවක වියදම් | 471,893,975 | 449,599,524 |
| ආයතනික වියදම් | 129,347,665 | 145,683,933 |
| වෙනත් පරිපාලන වියදම් | 210,703,778 | 177,216,800 |
| එකතුව | 811,945,418 | 772,500,258 |

| සටහන් 08 - මූල්‍ය හා වෙනත් වියදම් | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| බැංකු ගාස්තු | 5,173,915 | 4,347,146 |
| පැරණි ශේෂයන් නිවැරදි කිරීම සහ ලියා හැරීම | 7,314,579 | - |
| ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ සිදු කල ආයෝජන ලියා හැරීම් | - | 5,336,575 |
| එකතුව | 12,488,494 | 9,683,721 |

| සටහන් 09-ආදායම් බදු | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| වර්තමාන වසරේ ආදායම් බදු | 8,211,883 | 354,853,580 |
| පසුගිය වසරේ ආදායම් බදු - නිවැරදි කිරීම් සහ ගැලපීම් | 37,203,548 | - |
| විලම්භිත බදු ආපසු හැරවීම | (2,409,911) | (3,205,350) |
| **ආදායම් බදු වියදම්** | 43,005,519 | 351,648,230 |

## සටහන් 10 - දේපල යන්ත්‍ර හා උපකරණ - නිදහස් බදු දේපල

| | ඉඩම් රු. | ගොඩනැගිලි රු. | මෝටර් රථ රු. | පරිගණක හා උපාංග රු. | කාර්යාල උපකරණ රු. | දිනුම් ඇදීමේ යන්ත්‍ර රු. | ලී බඩු හා උපකරණ රු. | ප්‍රවර්ධන උපකරණ රු. | 2021 එකතුව රු. | 2020 එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත වටිනාකම** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 500,000,000 | 23,331,320 | 285,192,209 | 129,010,645 | 54,803,735 | 162,980,392 | 36,720,985 | 13,389,940 | 1,205,429,226 | 1,199,049,483 |
| පෙර වර්ෂය ගැලපීම | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය තුළ එකතුකිරීම් | - | - | - | 6,316,840 | 2,209,500 | - | 799,420 | - | 9,325,760 | 7,537,447 |
| වර්ෂය තුළ විකුණුම් | - | - | (13,230,000) | - | (3,996,410) | - | (180,870) | - | (17,407,280) | (1,157,704) |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - | |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **500,000,000** | **23,331,320** | **271,962,209** | **135,327,485** | **53,016,825** | **162,980,392** | **37,339,536** | **13,389,940** | **1,197,347,707** | **1,205,429,226** |
| | - | | | | | | | | | |
| ක්ෂය සඳහා ප්‍රතිපාදන | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | - | 7,421,411 | 264,211,773 | 120,084,510 | 47,658,745 | 161,369,091 | 18,941,684 | 9,292,403 | 628,979,617 | 582,390,987 |
| පෙර වර්ෂයේ ගැලපීම | - | - | - | - | - | - | - | - | - | 10,816 |
| වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | 1,166,566 | 15,963,770 | 5,127,285 | 2,912,941 | 1,229,700 | 3,592,637 | 4,038,354 | 34,031,253 | 47,016,254 |
| විකුණුම් සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | - | (13,230,000) | - | (3,958,796) | - | (142,264) | - | (17,331,059) | (438,440) |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **500,000,000** | **8,587,977** | **266,945,543** | **125,211,795** | **46,612,890** | **162,598,792** | **22,392,058** | **13,330,757** | **645,679,811** | **628,979,617** |
| | - | | | | | | | | | |
| **2021.12.31 දිනට ධාරණ වටිනාකම** | 500,000,000 | 14,743,343 | 5,016,666 | 10,115,690 | 6,403,936 | 381,600 | 14,947,478 | 59,182 | 551,667,896 | |
| **2020.12.31 දිනට ධාරණ වටිනාකම** | 500,000,000 | 15,909,909 | 20,980,436 | 8,926,136 | 7,144,991 | 1,611,300 | 17,779,301 | 4,097,537 | | 576,449,609 |
| **ක්ෂය අනුපාතය** | **-** | **05%** | **25%** | **25%** | **20%** | **20%** | **10%** | **33%** | | |

**ඉඩම - වොක්ෂෝල් වීදිය**
